ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

ක්‍රි. ව. 2012 දෙසැම්බර් 17 සඳුදා
05 වෙළුම - 09 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය

**විශේෂ නත්තල් කලාපය**



සිතුවම : නාමල් ද සිල්වා

## ජේසු බිළිඳුන්ගේ සාමය පිරි
## ශ්‍රී සුබ නත්තලක් පුංචි ඔබටත් වේවා !

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# නත්තල උදා වුණා

**ආදරණීය දුවේ පුතේ...**

2012 වසරේ නත්තල දැන් උදාවුනා. ජේසු බිළිඳුන් කුඩා ගවලෙනක් තුළ මිනිස් බව ගනිමින් මේ ලෝකයට පැමිණියේ මුළු මහත් මිනිස් සංහතිය පාපයේ බැඳි වලින් මුද ගෙන විමුක්තිය කරා ගෙන යන්නයි. ඒ උතුම් මාංශගතවීම පිළිබඳව අපි සැම නත්තලකම ගැඹුරින් මෙනෙහි කරනවා. මේ වසර තුළත් අපි පවුල් හැටියට එක්කාසු වෙලා සමරන්නේ ඒ උතුම් මිනිස් බව ගනිමින් මේ ලෝකයට ගෙනආ මිනිසියාවේ උතුම් බවයි.

ආදර දුවේ පුතේ, ශ්‍රී ලංකා දේශය තුළ අපි කතෝලිකයන් හැටියට ඉතා සුළු සංඛ්‍යාවක් සිටියත් අපේ ආධ්‍යාත්මික මංගල්‍යයන් මේ දේශය තුළ ඉමහත් බලපෑමක් ඇති කොට තිබෙනවා. විශේෂයෙන්ම නත්තල් මංගල්‍යය මේ දේශය තුළ ඉමහත් සේ බලපෑමක් ඇති කොට තිබෙන බව පැහැදිලියි. එයටත් හේතු ගණනාවක්ම බල පවත්වනවා.

නත්තල විශේෂ උපතක් සිහිපත් කිරීමක්. ඒ උපත ක්‍රිස්තුස් නම් අප ගැලවුම්කාර ස්වාමින් වහන්සේගේයි. මිනිසා නිරන්තරයෙන්ම ජීවිතයේ නව උදවක් හා නවෝදයක් සොයමින් තමයි ජීවත් වන්නේ. කිතුනු අපි බෞතීස්මය තුළින් හා විවිධ වූ ආධ්‍යාත්මික මංගල්‍යයන් තුළින් මේ නව ජීවිත උපතක් පිළිබඳව නිරන්තරයෙන්ම මෙනෙහි කරනවා. එහි තිබූ ආධ්‍යාත්මික අත්දැකීමක් සේ නත්තල අත් විඳින විට ඒ පැවැත්මෙහි ඇති කතෝලික නවතාවය අද අන් පුද්ගලයන් හා සමාජයන් හරහා ඇඩිව බැඳී පවතින්නට පටන් අරන්. ඒ ආධ්‍යාත්මික බැඳීම වචනයට දමා විස්තර නොකළත් අද අන් ලබ්ධීන්ගේ ජීවිත හරය තුළට මෙය නිරායාසයෙන්ම කා වැදිලා.

අනිත් කාරණය තමයි. සමාව ලබාදීම හා සමාව ලබා ගැන්මේ ඇති ඇති මාහැඟිතාවය නත්තල තුළින් ඉස්මතු වී පැවතීම. කතෝලික ඇදහිලිවන්තයින් මේ නත්තල සමාව ලබාදීමේ හා ලබා ගැනීමේ ජීවිත පැවැත්මක් වෙතට ගෙන යන්නට සැම නත්තලකදීම උත්සාහකරනවා. එය පාරි ශුද්ධත්වයේ ආධ්‍යාත්මික පණිවුඩයක්. මෙය ගෙවුනු දශක ගණනාවක් පුරා පැවතී ඒම අද අන් ලබ්ධිකයින් අතරත් ධර්මතාවයක් සේ ප්‍රචලිතව පවතිනවා. ඒ ධාර්මික හැඟීම පවසාලීමට ''නත්තල'' මේ දේශය තුළ ඉමහත් සේ ඉවහල් වී තිබෙනවා. ඒ නිසාම නත්තල සැමරීමේ අත්දැකීමට කිතුනුවන් නොවන අයත් නිරායාසයෙන්ම පෙළඹී තිබෙනවා.




දැන්, ආදර දුවේ පුතේ, විශේෂයෙන්ම මෙවරත් නත්තල තුළදී මේ උතුම් මානුෂික හැඟීම විවිධ ජාතීන් හා ආගමිකයින් අතර විහිද යන ආකාරය ඔබ හොඳකාරවම දුටුවා නේද?. සැබවින්ම එය සාමයේ මනරම් පණිවිඩයක් සේ අවශ්‍යයෙන්ම අර්ථ ගැන්විය හැකියි.

ඉතිං අන් සමාජයන් මෙම උත්තරීතර මංගල්‍යයේ සැමරුම බාහිර වශයෙන් හෝ සමරන්නට පුරුදු වී සිටින්නෙත් අප කතෝලිකයින් හැටියට සාමුහිකව මෙය සාමයේ අත්දැකීමක් බවට පත් කරගෙන තිබෙන නිසයි. ඒ අත්දැකීම සැමරීමක්. දුක වේදනාව හදෙහි රඳවාගෙන වේදනාකාරී හැඟීමක් හා අඳුරු පින්තූරයක් නත්තල තුළින් දිස්කළ යුතු නැහැ. මෙය පවුලේ මංගල්‍යයක් සේ බාහිරවත් අර්ථාන්විතව සැමරීමට කතෝලිකයින් යම් පන්නරයක් ලබා සිටින්නේ ඒ නිසයි. නමුත් ඒ බාහිර සැමරුමේ සීමා බන්ධනයන් ඇති බවත් අප තේරුම් ගත යුතුයි. දැන් කතෝලික ජනතාව මෙය වටහාගෙනයි තිබෙන්නේ.

එම නිසා, ආදර දුවේ පුතේ, අසුබවාදීව නත්තලේ බාහිර සංස්කෘතිය ගැන ආඩපාලි සැමද කිමෙන් පලක් වන්නේ නැහැ. සැම දෙව් මැදුරකම , ධර්මෝපදේශ පන්තියකම, පවුලේ එකමුතුවකදීම නත්තලේ උතුම් අධ්‍යාත්මික බව කථා කරනවා. රූපවාහිනී මාධ්‍යය කරන්නේ නත්තල සැමරීමක් නොවෙයි. උත්සව සමයක් මුල් කොට ගෙන පොදුවේ ජනතාවට උත්සව සමයක් ගැන කියා පෑමයි. ඒ නිසා එයින් කිසිදු අසුබවාදී දැක්මකට නොයා 2012 නත්තල ආධ්‍යාත්මිකව අපත් සමරනවා, සැමරුවා කියන ඒකායන ප්‍රාර්ථනාවට අප ලං විය යුතුමයි.

මේ නත්තල් උදවේ එළිපත්ත මතදී ඔබට එය කිරීම කොහෙත්ම අසීරු වන්නේ නැහැ. මන්ද ''උපතේ '' ඇති අසිරිය අන් කාටත් වඩා කතෝලික ඔබ පැහැදිලිව වටහා ගෙන තිබෙන නිසා.

**ඔබ සැමට ශ්‍රී සුභ නත්තලක් ප්‍රාර්ථනා කරමි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා




සුබ නත්තලක් !

# හෙළ දිව පෘතුගීසීනට බිලි දීම

කිතු දහම හෙවත් කතෝලික ධර්මය ක්‍රමයෙන් දිවයිනේ බටහිර මුහුදුබඩ පළාත් තුළ ව්‍යාප්ත වී ගියේ ය. මේ අතර පෘතුගීසීන් රටේ දේශපාලනයට ඇඟිලි ගසන්නටද විය. මෙයට වඩාත්ම හේතු වූයේ අප රජවරුන් අතර පැවැති ගැටුම් ය.

ප්‍රථමයෙන් වෙළඳම වෙත යොමු වූ පෘතුගීසීනට ප්‍රබල සතුරන් වූයේ මෙරට විසූ මරක්කල වෙළඳ ව්‍යාපාරික ජන කොටස්ය. කුරුඳු , කුළුබඩු යනාදිය මෙන් ම ඇත් දළ මැණික් ආදී භාණ්ඩ රැසක් රට පැටවීමේ එවකට යෙදී සිටි මොවුහු පෘතුගීසීන් දුටුවේ වෙළඳ අභියෝග කරු පිරිසක් සැටියට යි.

තව ද කලකට පෙර යුරෝපයේ පැවැති ආගමික ගැටුම් ද මොවුන් ගේ සිත් තුළ විය. එනම් ඉස්ලාම් ධර්මය ආරම්භ වීමත් සමග පලස්තීනයෙන් හෙවත් ශුද්ධවූ දේශයෙන් ඔවුන් බැහැර කර ඇමීම සඳහා දකුණු යුරෝපීය රටවල් සංවිධානය කළ යුද ගැටුම් , තවමත් සිත් රැඳී තිබිණි.

ක්‍රි.ව. 1096 සහ 1270 අතර පැවැති ප්‍රධාන ගැටුම් හතක් විය. මේ මතකය මෙන් ම වෙළඳ තරගය ද අනුව පෘතුගීසීන් මෙහි පා තැබීම විශාල තර්ජනයක් ලෙස සැලැකූ මරක්කල වෙළඳ පිරිස අප හෙළ පිරිස ඔවුනට විරුද්ධව කුපිත කළහ.

කෙසේ වෙතත් ක්‍රි.ව. 1505 දී අනපේක්ෂිතව මෙහි ගොඩ වැදුනත් පෘතුගීසීහු මෙහි එවර රැඳී නොසිටියෝ ය. එවකට මෙහි රජ කළ ධර්ම පරාක්‍රමබාහු ආරාධනා කළ නමුත් ඔවුන් පෙරළා ඉන්දියාව බලා ගියෝ ය.

යළි ක්‍රි.ව. 1517 දී වරක් පැමිණ ආපසු ගොස් රාජ්‍ය ආරාධනය පරිදි මෙහි පැමිණියේ ක්‍රි.ව. 1522 දී ය. එතැන් සිට ද ඔවුන් යෙදී සිටියේ වෙළඳාමෙහි ය.

අවසානයේ දී අප අභාග්‍යය වූයේ විජයබාහු රජු ඝාතනය කිරීමත් සමග හටගත් සහෝදර රජ ගැටුමයි.

පියාගෙන් පසු තමනට රජකම නොලැබේය යන සැකය ඇති කැර ගත් විජයබාහු රජුගේ පුතුන්

**අවසානයේ දී තම ආරක්ෂාවත් යුද ශක්තියත් පතා බුවනෙකබාහු රජතුමා පෘතුගීසි සහාය ලබා ගැනීම සඳහා පෙළඹුණේ ය. ඒ සඳහා ඔහු ක්‍රි.ව. 1542 දී ක්‍රියාත්මක වූ අතර මායාදුන්නේ ඉන්දියාවේ සිටි මරක්කල නායක "සැමොරින් ගේ " සහාය ලබා ගත්තේ ය.**



**සිරිලක කිතුනු 11 ඉතිහාසය**

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසිනි**

තිදෙනා වූ බුවනෙකබාහු , මායාදුන්නේ සහ රයිගම් බණ්ඩාර සැලැසුම්කොට පියා මරා දැමුවෝ ය.

ඉනික්බිති සහෝදර පිරිස අතර කෝට්ටේ සිංහාසනය සඳහා ඇති වූයේ විශාල ගැටුමකි. අවසානයේ දී ප්‍රශ්නය විසඳන ලද්දේ කෝට්ටේ රාජධානිය කොටස් කර තිදෙනා අතර බෙදා දීමෙන් ය.

මේ අනුව වැඩිමහල් පුත්‍රයා වූ බුවනෙක බාහු කෝට්ටේ රජු ලෙස ද මායාදුන්නේ සීතාවක රජු ලෙස ද රයිගම් බණ්ඩාර රයිගම කෝරළයෙ රජු ලෙස ද පත්වීම් ලදහ.

එහෙත් මෙයින් මායාදුන්නේ සෑහීමට පත් නොවීය. ඔහුගේ එක ම අපේක්ෂාව වූයේ කෝට්ටේ රජු වීම යි. මෙම අපේක්ෂාව සපුරා ගැනීම් වස් හෙතෙම තම සොයුරා වූ බුවනෙක බාහු සමග යුද වැදුනේ ය.

අවසානයේ දී තම ආරක්ෂාවත් යුද ශක්තියත් පතා බුවනෙකබාහු රජතුමා පෘතුගීසි සහාය ලබා ගැනීම සඳහා පෙළඹුණේ ය. ඒ සඳහා ඔහු ක්‍රි.ව. 1542 දී ක්‍රියාත්මක වූ අතර මායාදුන්නේ ඉන්දියාවේ සිටි මරක්කල නායක “සැමොරින් ගේ ” සහාය ලබා ගත්තේ ය.

මෙයින් රට දෙකඩ විය විදේශි බලවේගවලට ගොදුරු විය. ජනතාව විදේශ බලවේගයනට ගොදුරු වූහ.

ලමා ප්‍රදීපය



සුබ නත්තලක් !

කිතුනු උරුමය

# නත්තලට දෙරට වඩින වාර්ෂික සඟරා

**කතෝලික ජනතාව පමණක් නොව මුළු මහත් මිහිතලයම නැවුම් හැඟීමකින් පිරී ඉතිරී යන "නත්තල්" හා බැඳි විවිධ සිරිත් විරිත් චාරිත්‍ර පවතී. ශ්‍රී ලංකාවේ ඉපැරණි පුවත්පත මෙන්ම සඟරාවද කතෝලිකයන්ගේ උරුමයකි. වර්ෂ 1866 ජුනි 07 ද ඇරැඹී "ඥනාර්ථ ප්‍රදීපය" මෙන්ම වර්ෂ 1899 ජනවාරියේ ආරම්භ වූ "භක්ති ප්‍රබෝධනය" සඟරාවද මෙරට තවමත් පළවන ඉපැරැණිම සිංහල පුවත්පත හා සඟරාවය.**




නත්තල හා බැඳි කැරොල් ගී සුබ පැතුම් පත් ආදී විවිධාංග අතරට නත්තල උදෙසාම නිකුත්වූ නත්තල් සඟරාද වේ. දැනට පළවන පැරැණිම නත්තල් සඟරාව ''පියුම'' නම් වේ. ඇම් ඇන්ටනි ප්‍රදිනන්දස් මහතාගේ සංස්කරණයක් වන පියුම 2012 දී පළවන්නේ 57 වැනි වතාවටය. මේ අතර රිචඩ් වසන්තකුමාර 1958 දී අරඹා ඔහුගේ ඇවෑමෙන් ඇන්තනි ජයලත් ප්‍රනාන්දුගේ සංස්කාරකත්වයෙන් පළවන ''සාම මිහිර'' සඟරාව නත්තලට දෙරින් දෙර හිනැහෙයි. වර්ෂ 1976 දී ආරම්භ කළ ''උඳුවප් මිහිර '' ජනතා නත්තල් වාර්ෂිකය මැක්සිමස් රෝයි පෙරේරා හා ශිරාන් මෛත්‍රිගේ සංස්කරණයකි. 2012 වසරේදී එහි 36 වන කලාපය නිකුත් වී තිබේ.

නත්තල් වාර්ෂික සඟරාවන්හි ඉතිහාසය පිරික්සා බලද්දී බොහෝ සඟරා අතීතයේ කලින්කල පළවී ඇතත් දිගටම පවත්වා ගෙන යෑමේ අභියෝගය ජයගැනීමට සමත්වී නැත. ගීතාංජලී මැයෙන්ද - පිදුම මැයෙන්ද නත්තල් සඟරා පළවී ඇතත් ඒවායේ ආයුෂ ඉතා කෙටිවිය.

1903 දෙසැම්බර් මාසයේදී මොරටුවෙන් ''පහන් තරුව'' මැයෙන් සඟරාවක් මොරටුවේ ජෝසප් ඇන්ඩෲ ප්‍රනාන්දු විද්වතා ආරම්භ කළ අතර කලාපයක් සත 12 කට මිළ නියම කර තිබිණ. එහෙත් කාලයත් සමග එය නතර වී ගොසිනි. භක්ති ප්‍රබෝධනය සඟරාවද කාලයක් පහන්තරුව ලෙස පළවී ඇතත් මේ කියු පහන් තරුව එය නොවේ. ප්‍රැන්සිස් පී ගුණසේකර ''පිනිබිඳු'' නමින් යෝධ නත්තල් සඟරාවක් පළකළ අතර ''නත්තල් තරු'', ''දීප්ති '', ''ගීතිකා'' , ''හමුව '' ආදී වශයෙන් නත්තල් සඟරා රැසක් කළඑළි දුටුවේය.

වර්ෂ 1959 දී හලාවත රදගුරු වසමේ ගරු ජෝ කුවින්ටස් පෙරේරා පියතුමා හා ගරු බීඩ් ප්‍රනාන්දු පියතුමා සංස්කරණය කළ ''කතෝලික නත්තල් කලාපය '' එකල පළවූ වඩාත් හරබර ශාස්ත්‍රීය, සඟරාවකි. මිළ රු. 1.50 කි.කඩලානෙන් කළ එළි දුටු ''දීප්ති'' නත්තල් සඟරාව මර්වින් පෙරේරා හා බෙනඩික් කුමාරගේ සංස්කරණයකි. මේ අතර ''දූතයා'' සඟරාවද නත්තලට විශේෂ සංස්කෘතික වැදගත් කමක් සහිත කලාපයක් නිකුත් කළ අතර කිතු උදය නමින්ද නත්තල් සඟරාවක් කලක් පළවිය.

මේ වන විට දිවයින පුවත්පතේ පුවත් පත් කලාවේදියකු වන නෝමන් පලිහවඩනයන් 1966 පටන් වාර්ෂිකව නත්තලට ''ක්‍රිස්තු භක්ති'' මැයෙන් සඟරාවක් වසර ගණනාවක් පවත්වාගෙන ආවේ බොදුනුවන්ගේද සහය ඇතිවය.

මේ රටේ වාර්ෂිකව පළවන නත්තල් සඟරා අතර හංවැල්ල මීසම් පවුලේ ''උඳුවප් තරුව'' ඇන්තනි හෙට්ටිආරච්චිගේ සංස්කරණයකි.

2012 දී අටවන කලාපය නිකුත් වීමට නියමිතව තිබුණද අවාසනාවකට මෙන් සංස්කාරක වරයාගේ අක්ෂි රෝගී තත්වය ඊට හරස්වූ බැව් දැනගන්නට තිබේ. වෙන්නප්පුවේ ප්‍රියන්ත පීටර්ස් සංස්කරණය කරන ''උපත'' නත්තල් සඟරාවේ තෙවන කලාපය මෙවර නත්තලට එළි දකී. මේ අතර 2012 නත්තලේදී රත්නපුර රදගුරු වසමෙන් ''මිණි උදන'' නමින් නත්තල් සඟරාවක් කළ එළි දකින අතර දෙහිගහ පිටියේ ජෝශප් ජයසිරි ප්‍රනාන්දු එහි සංස්කරණය බාරව සිටී.

ඉතිං දුවේ පුතේ ! මේ රටේ නත්තල් සඟරා ඉතිහාසය වෙනම පර්යේෂණයක් සඳහා කදිම තෝතැන්නකි. මේ සෑම ප්‍රකාශනයක්ම නත්තලේ සැබෑ හරය කුළු ගන්වමින් කිතුනු අරුත බෙදු හදු ගැන්මට දරණ වෑයම අප කොයි කවුරුත් අගය කළ යුතුයි නේද?

**ශිරාන් මෛත්‍රි**

## සුබ නත්තලක් !

## ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වූ






දියලගොඩ සාන්ත බෙර්නාදෙත් පෙර පාසලේ දරු දැරියන්ගේ වාර්ෂික විවිධ ප්‍රසංගය , නොබෝද දියලගොඩ රෝ.ක ප්‍රාථමික විදුහලේදී ගරු මේරි යෝලන්ඩ් පැවිදි සොයුරිය , හා ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවත්වුණි. පෙර පාසලේ අධ්‍යක්ෂිකා , ගරු මේරී රීටා මව්තුමිය හා ගුරු භවතුන්ගේ උත්සහයත් දෙමාපියන්ගේ සහයත් මේ සඳහා ලැබිණි. දරු දැරියන් විසින් ඉදිරිපත් කරන ලද විශේෂාංගයක් මෙහි දැක්වේ.

**(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**




පමුණුගම , සේදවත්ත යහපත් එඬේරාගේ ළදරුපාසලේ වාර්ෂික උත්සවය පමුණුගම මීසම් සහයක ගරු රසික ලෝරන්ස් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි. එහිදි සිඟිත්තන් ඉදිරිපත් කළ විශේෂාංගයක් සේයාරුවෙන් දිස්වේ. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**




කඳාන සා. සෙබස්තියන් කන්‍යාරාමයේ පෙර පාසල් විවිධ ප්‍රසංගය සා. සෙබස්තියන් සිද්ධස්ථාන පරිපාලක ගරු නිහාල් අයිවන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. කන්‍යාරාමයේ ගරු නිමාලි ප්‍රනාන්දු (ය.එ.නි) ප්‍රධාන මව් තුමියගේ උපදෙස් මත ගුරු මණ්ඩලය හා දෙමාපියන් එක්ව මෙය සංවිධානය කරන ලදි. **(පියල් ජයකොඩි)**



බෝපිටිය එස්.පී.ඒ. විදුමග පෙර පාසලේ වාර්ෂික ත්‍යාග ප්‍රදනෝත්සවය හා විවිධ ප්‍රසංගය පමුණුගම මහා විදුහලේ ප්‍රාථමික අංශ භාර විදුහල්පතිනි විශාඛා සෙනෙවිරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියද පමුණුගම මහා විදුහල් ජයන්ති ශාලාවේදී පැවැත්විණි. විදුහල්පතිනි සිරි සුභාෂිනි මහත්මියගේ මෙහෙයවීමෙන් තෑගි උළෙල සංවිධානය කෙරිණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **(ඇන්ටන් ජයසූරිය)**






සුබ නත්තලක් !

අගුණවිල
පීටර් කැමිලස්
සුබසිංහ විසිනි.

# නත්තල් සුබ පැතුම් පතේ ඉතිහාසය

නත්තල් සුබ පැතුම් පතක් යැවීමේ සම්ප්‍රදයට අවුරුදු 150 ක පමණ ඉතිහාසයක් ඇත. ඉංග්‍රීසි ජාතික චිත්‍ර ශිල්පියකු වූ ජෝන් කැල්කොට් හොර්ස්ලි විසින් 1843 අඳින ලද සිතුවමක් මුල්ම නත්තල් පත ලෙස සැලකේ. දුප්පත් මිනිසුන්ට රෙදි හා ආහාර ලබා දෙන පින්තූරයක් මැද නත්තල් අසිරිය විඳින පවුලක රූපයක් එම නත්තල් පතේ චිත්‍රයේ සටහන් වී තිබුනි. එම නත්තල් සුභපැතුම් පතේ අ මෙරි ක්‍රිස්මස් ඇන්ඩ් හැපි නිව් යාර් ටු යූ යනුවෙන් ද සඳහන් කර ඇත.

සුභපැතුම් පත් හුවමාරුව වඩා ප්‍රචලිත වුවේ 1840 දී මුද්දර භාවිතය ඇරඹීමත් සමගය. මුද්‍රණ කර්මාන්තය දියුණු වීමත් සමග සුභපැතුම් පත් නව ඉදිරි පියවර තැබීය. 1870 වසර වන විට ඇමරිකානු සමාජයේ නත්තල් සුබ පැතුම් පත් සීඝ්‍ර ලෙස ජනප්‍රිය වී ඇත. මේ වන විට වර්ණ සුබපැතුම් පත්ද නිර්මාණය වී තිබුණි. මුලින්ම විවිධ වර්ණ 20 පමණ පරාසයක් තුළ නත්තල් සුබ පැතුම් පත් නිර්මාණය වී තිබේ.

1881 වන විට ලුවිස් ප්‍රැන්ක් නම් පුද්ගලයා වසරකට නත්තල් සුබපැතුම් පත් මිලියන පහකට අධික සංඛ්‍යාවක් නිකුත් කර තිබේ . නත්තල් සුබ පැතුම් පතකට නත්තල් සීයාගේ රුව මුලින්ම පැමින ඇත්තේ ඇමරිකානු සිවිල් යුද සමයේදීය. ජනාධිපති එබ්‍රහම් ලින්කන් එකල විසූ ජනප්‍රිය දේශපාලන කාටුන් ශිල්පියකු වූ තෝමස් නාස්ට්ට නත්තල් සීයා සුබ පැතුම්පතට එකතු කරන්නැයි කළ ඉල්ලීමක් අනුව නත්තල් සීයාගේ රුව සුබපැතුම් පතට එක්කර තිබේ.

යුද සෙබළුන්ගේ මානසික තත්වය වර්ධනය කිරීම සඳහා ජනාධිපතිවරයා මෙම ඉල්ලීම කර තිබේ. 1960 - 1970 කාලයේදී කුඩා ළමුන් මල් හා සාමය සංකේතවත් කරන නත්තල් පත් ජනප්‍රිය වී තිබේ. නත්තල් ගස් , මල්වෙඩි, හිම , පිනිමුවන්, තරු, සීනු , දැල්වෙන ඉටි පහන්, ගවලෙන , දේව දුතයින්, එඬේරු, සුබ පැතුම්පත් වල බහුල නිර්මාණයන්ය. නත්තල් සුබපැතුම් පත් හුවමාරු කිරීමේ ක්‍රමය මේ වන විට අන්තර්ජාලය කරාද පැමිණ තිබේ. (පොත පත ඇසුරෙනි)

## ගුරුබැවිල දිසා ධර්මදුත ළමා සමාජ කැරොල් තරග ප්‍රතිඵල

ගුරුබැවිල දිසා ධර්මදූත ළමා සමාජ 2012 නත්තල් කැරොල් ගායනා තරග වග මීසම් සේවක ගරු ප්‍රසන්න සංජීව , හංවැල්ල සභයක ගරු ටිරොන් අජිත් යන පියතුමන් ඇතුලු ගරු පැවිදි සොහොයුරියන්ගේ ප්‍රධානත්වයෙන් පසු ගියදා කළු අග්ගල සාන්ත ජෝන් බොස්කෝ විදුහල රංග ශාලාවේදී පැවැත්වුනි.

මෙයට කණ්ඩායම් අටක් ඉදිරිපත් වූ අතර එහිදී පළමු ස්ථානය වැලිකන්න වග කණ්ඩායම දිනා ගත් අතර, දෙවැනි හා තෙවන ස්ථාන පිළිවෙලින් හංවැල්ල ළමා නගරය හා තරාල කණ්ඩායම දිනා ගන්නා ලදි.

ඇන්තනි හෙට්ටිආරච්චි.

## ජේසු බබා



උඳුවප් රැයේ සීතල දවසක
පිදුරු වලින් වැසී තිබු පුංචි
පැල්පතක ජේසු බබා සමග
මරියතුමිය ඇකයෙහි ඇඟිලි
උරමින් සිටි පුංචි කුමරා
ඔබ නොවේද ජේසු සමිඳුනී.....
ඔබ වෙත පැමිණි පඬිවරු තිදෙනා
ගෙන ආ ගන්ධ තුවරලා වැනි දෑ
ගෙනෙන්නට මට නොමැති වුවත්
මගේ දුබල සිත ඔබහට
දෙන්නට දණින් වැටී මම එන්නෙමි සමිඳුනි

**නිශාලි පෙරේරා**
13 ශ්‍රේණිය (කලා අංශය)
දංකොටුව බාලිකා මහා විදුහල

සුබ නත්තලක් !

# විශ්වසනීය නත්තලක්



අද අපි සමරන නත්තල ජේසු බිලිඳුන්ගේ උපත සිහිකිරීම සඳහා ද නැතිනම් අපගේ ධනය, බලය, තේජස , පුරසාරම් පෙන්වීමට සිදුකරන නත්තලක්ද? ධනවත් අය “රසමසවුළු” සමග ආහාර වල රස බලද්දී දිළිඳු පවුලක් සුළු ආහාරයක් අනුභව කර නත්තල සමරනු ලබයි. මෙහි සැබෑ නත්තල කුමක්ද? මෙය ගැලපෙන උපමාවක් වශයෙන් අය කැමියා හා පරිසි වරයාගේ උපමාවෙන් යම් සම්බන්ධයක් ගත හැක. පරිසිවරයා තමන්ගේ යහපත වර්ණනා කරයි. අය කැමියා තමන්ගේ පව් මෙනෙහි කරයි. ධනවත් පවුල සමාජයට පෙනෙන්නට පාටි දමයි. විශාල ප්‍රිය සාද පවත්වයි. මත්පැන් බෝතලයට නත්තල සීමා කරයි. එම අය පරිසි වරයාට සමාන නොවන්නේද ? එහෙත් තමන්ගේ තරමින් තමන්ට හැකි ලෙස සැබෑ නත්තල සමරන්නේ දිළිඳු පවුල්ය. එසේත් නැතිනම් අය කැමියාය. ඔහුගේ සැබෑ නත්තල භුක්ති විඳිති.

අද අප ගතකරන්නේ විශ්වසනීය නත්තලක්ද යන්න ඇත්තෙන්ම ඇත්තේ ප්‍රශ්නාර්ථයක් පමණි. අපගේ නත්තල “දුගියා බත් කන දා” විය යුතුය. එදා ගවලෙන අප ජීවිතයට ආදර්ශකොට ගෙන තිබෙනවාද? එම දිළිඳු කම අප ජීවිතයට ආදර්ශ කර ගත්තා නම් සැබවින්ම අපට විශ්වසනීය නත්තලක් සැමරිය හැක. එදා ජේසු සමිඳුන් බැහැපත් වූවාමෙන් අපටද බැහැපත් විය හැකිනම් එයඉතා අගනේය. සැබෑ ලෙසම අප ගත කරන නත්තල් සහ අනාගතයේ සමරන්න තිබෙන නත්තල අපගේ විශ්වාසය පිළිබඳවය.

එදා මරියතුමිය දෙවියන් වහන්සේගේ කැමැත්ත බාර නොගත්තානම් අපට අදටත් විශ්වාසය පිහිටන්නේ නැත. එතුමිය එදා දේවදූතයා මංගලම් කියු අවස්ථාවේදී ඇගේ විශ්වාසය ප්‍රකාශ කරනලදි. එමෙන්ම දේව පුතණුවන් දේව මාලිගාවේ පඬිවරුන් මැද සිට දේශනා කරන විට එය දුටු මරිය මවුන් එය තමන්ගේ සිත්හි නිදන් කරගත්තාය. එය එතුමියගේ බැහැපත්කමත් විශ්වාසයත් නිසාය.

අසීමිත ලෙස ප්‍රිය සාදවලට නත්තල් සමය තුළ වියදම් කරති. එම මුදලින් අපට හැකිනම් අනාථයන්ට පිහිටවන්නට වැඩි හිටි නිවාස , ආබාධිත පුද්ගලයන් වෙසෙන නිවාසයකට ආධාර උපකාරයක් සිදු කිරීමට. එසේ නම් මර්සලින් ජයකොඩි පියතුමා ගේ කියමන වන “මගේ නත්තල දුගීයා බත්කන දාය” යන්න වදන් පෙලක් ම නොවන්නට අපගේ ජීවිත තුළින්ද එයට අරුතක් එක් කළ හැකිවේ. එවිට අපට සැබෑලෙසම නත්තල ගත කිරීමට හැකියාවක් ලැබෙනු ඇත.

**සතිර නානායක්කාර**
ශාන්ත ජෝසප් දෙව්සත්හල - පූර්නවත්ත
(මහනුවර පදවිය)

# නත්තලේ අසිරිය

එද නත්තලේ .....
මෙදා නත්තලේ ......
මෙද නත්තලේ සිරි
ජය ලබා ගන්නට සමිඳුනේ
දුක් වුනා ජීවිතේ .......
නත්තලේ සතුට උදාවී
සාමය බෙදූවා නත්තලේ
ගැලූවා නත්තලේ ප්‍රීතිය ........

ශකිලා මධූෂානි රාජපක්ෂ
13 ශ්‍රේණිය (කලා අංශය)
ලූර්දු දේව මාතා දහම් පාසල - නාත්තන්ඩිය



සුබ නත්තලක්



උඳුවප් මස මෙලොව එළිය දුටු ජේසු බිළිඳාණන්,
දෙව්මව්න් තුරුලේ සීතට ගුලි වෙමින්,
අපට කියන්නේ සාමයේ අරුත නොවේද?
දේව මෑණියන්ගේ පෙම්බර මුහුණෙන්
දිස්වන්නේ සහජීවනයයි, සංහිඳියාවයි.
මිනිසත්කම නොහඳුනන මේ සමාජයේ......
මුල් බැස තිබෙන්නේ පාපයයි.....
පයට පෑගෙන දූවිල්ලක් තරම්වත් ගණන්
නොගන්නා සාමය
යටපත් කරගෙන නැඟී සිටින්නේ
ඝන අන්ධකාරයයි
මිනිසත් කමට ගරු කරන්න, සාමය, සහජීවනය වපුරන්න,
පාපය මරා මිනිසත් බව ගෙන මෙලොවට
පැමිණෙන්නට සිටින තම පියාණන්
ආදරයෙන් පිළිගන්න.......
එයයි සැබෑ නත්තල
එයයි සැබෑ කිතුනුකම

**සිකිලා ජයාංගනී ජයකොඩි**
12 ශ්‍රේණිය
දංකොටුව බාලිකා මහ විදුහල

සාමයේ කුමරුනී ඔබගේ උපන් දිනය
මා සමරන්නේ නැති බැරි කෙනෙකුට
උපකාර කිරීමෙනි
ජේසු බිළිඳුනී , ඔබ
ඉපදුන දූගී පැලේ
අදටත් රැස් විහිදේ
ඒ කුමරුගේ හරසර
බලයෙනී

සාමයේ
කුමාරයාණනී,
ජේසූ බිළිඳුගේ
උපතින් අපගේ
ජීවිතයට නව පණක්
ලබමින්
(ඇතුලාන්ත සිත්
හැරීමකින් )
ජේසු බිළිඳුගේ ජීවිතයට
ලංවෙමින්
සාමයේ පනිවුඩය ලොවට දෙමින්
ජේසුගෙ උපත ආදර්ශමත් ලෙස,
සරලව සමරන්නට සූදානම් වෙමු



**ෂෙනෝන් කාවින්ද**
09 ශ්‍රේණිය
ශා. රෝගුස් මුනි දහම් පාසල - දෑලතුර

# නත්තල් සීයා

සුදට සුදේ සුදු රැවුලයි
දෙපා දිගට රතු ඇඳුමයි
දෑත් දෙකට බැළුම් මිටයි තෑගි
ගොඩයි
ගෙන ආවේ නත්තල් සීයයි.
සීනු හඬ නද දෙයි
සීයා අපට තෑගි බෙදයි
පුංචි ළමයි ඒවා බලා
සතුටු සිතින් සිනා සලයි

**පියුම් කෝකිලා මධුෂාණි**
06 ශ්‍රේණිය
සා. හෙලේනා දහම් පාසල -
හිරිපොකුණ

සීත සුළං ගත දැවටෙන්නේ
ගස් වැල් තාලෙට නැලවෙන්නේ
අප සැම සතුටින් නැහැවෙන්නේ
සුන්දර නත්තල උදා වෙන්නේ

කිතු සමිඳුන්ගේ උපත සමරමින්
ජය ගී සැම තැන පැතිරෙන්නේ
සුන්දර මඟුලක අසිරිය ලැබ දී
ලෝ ගැළවුම්කරු පැමිණෙන්නේ

**තරුෂි පෙරේරා**
09 ශ්‍රේණිය
ශා. ආනා දහම් පාසල - කුරණ



වල්ගා තරුව පායලා එළියක් වුවා
රජතුන් කට්ටුව පඬුරු රැගෙන ආවා
ජේසු බබා ගවහලේ ටිකිරි සිනා පෑවා
සව්ලෝ සත වෙත සෙත සැල සුවා

නැති බැරි අය වෙත බෙදා හදාගෙන
ඇති සැම දෙන සිත් දනට පිනට නැමෙන
පිරිසිදු සිත් සැම දෙන හට ලැබෙන
නත්තල් දින සිරි ලොවට බැබළෙන



**ශ්‍රීයාන් මධුෂ**
7 ශ්‍රේණිය
ලූර්දු මාතා දහම් පාසල - නාත්තන්ඩිය

# නත්තල ආධ්‍යාත්මිකව පුංචි අපි දකින හැටි

## සුබ නත්තලක්



පුංචි අප සැමට නත්තල
හරිම මිහිරියි.
හරිම ආසයි.
හරිම සතුටුයි.
ඒ උනාට අප ඒ මිහිරි
නත්තල අන් අය සමඟ
බෙදා ගන්නවාද?
නැතිනම් නත්තල අපිව බදා ගන්නවාද?
නත්තලේ මිහිර දැනෙන්න නම් අනික් අය සමඟ සාමයෙන්,
සතුටෙන් නත්තල බෙදා ගත යුතුය. සාමය රජකර විය යුතුය.

**ඇන් ට්‍රිෂා කාවින්දි**
7 ශ්‍රේණිය
වික්ෂෝප දේව
මාතා දහම් පාසල
කඳවල



සුදතුම් වරමින් මරිය තුමිය කුසතුළ ජේසුබබා පිළිසිඳ ගත්තද
ජුසේ තුමා නොදත් නිසා මරිය තුමිය සැක කළාද
එසේ නම් අන් අය වගේ අපිත් ගබ්සාවක් කරමු කීවද
එදා මරිය තුමිය සහ ජුසේ තුමා දෙව් අණ පිළිගත්තා නේද

අද කාලේදි වගේ මෙවැනි දෙයක් සිදු වුවහොත් එලෙසින්
අනිවාර්ය වෙයි ගබ්සාවක් දෙමාපියන් කැමති ලෙසින්
එදත් අනේ සිදු වූවා නම් ගබ්සාවක් කැමති ලෙසින්
අනේ අපට කොයින්ද ජේසු බබෙක් හා
නත්තලක් සිහිකරන්න මෙලෙසින්

**ඇන් විනෝලි මධුෂානි**
11 ශ්‍රේණිය
ශා. ජෝශප් දහම් පාසල - පමුණුගම



සුරසේනාවෝ
සධු නගද්දි
ස්වර්ගයේ
දොරගුළු
විවර වුවා ගව
ඔරුවේ බිලිඳුන්
හිනැහෙද්දී
ගයමු වයමු
සැවොමා
මේ නත්තල්
දිනයේ

ප්‍රේමය
වියැකෙනා
ආදරේ
නොදැනෙනා
සත්‍ය ගිලිහෙනා
මේ ලොවේ
අඳුරින් පිරි
ලොව පහන්
කරන්නට
වඩින්න දෙවි
පුතු මේ ලෝ
තලයට නත්තලේ



පාපයෙන් කිතු
හද වෙලිලා
නපුරා ලෝ අද
රජ වීලා
ගැළවුම ගෙන
වැඩියා - පව්
සත වෙත
මනු සත මුදන
ලෙසේ ගවහලේ
ජනිත වුණෝ

ප්‍රේමය වියැකෙනා........

ධන බලයෙන් ලෝ රජ වීලා - දිළිඳා ලෝ තනි වීලා
දිළිදෙක් විලසින් වැඩියා - අප වෙත
සාමය බෙදන ලෙසේ
දෙව් පුත් ජනිත වුණෝ

ප්‍රේමය වියැකෙනා........

**පද රචනය - ක්‍රිෂාන් රංගන තමෙල්**
13 ශ්‍රේණිය
සා/ පාවුලු දෙව්සත්හල - මාරවිල

# නත්තලට සිතුවිල්ලක්

ආදර දුවේ පුතේ, මේ සතියේ මම කැමතියි ඔබත් සමග බෙදා ගන්න තවත් ඇත්ත කථාවක් . මා විසින් දිළිඳු ධීවර දරුවන් උදෙසා පවත්වාගෙන යනු ලබන සංවේදනා සවස පාසලට මීට මාස දෙකකට කලින් අලුතෙන් ගැනු ළමයි දෙන්නෙක් ආවා. මෙම ළමයි දෙන්නා ටිකක් වෙනස් මේ ළමයි දෙන්නගේ මුහුණ දිහා බලන කොට ලොකු අසරණ බවක් දුටුවා. මේ ළමයි මා සමග මුවපුරා සිනා සී දිනපතාම මේ පංතියට පැමිණීමට කැමති බව සඳහන් කළත් මට සිතුනා මේ දරුවො හෙළි දරව් නොකරන දුක්බර කථාවක් ඇති කියලා.




එහෙත් දින කිපයකට පසු මේ දරුවෝ හිටි ගමන්ම මගේ පංතියට පැමිණීම නතර කළා. ඒ නිසා මම සහ මගේ සහයක ගුරුතුමිය තීරණය කළා මග සලකුණු අසාගෙන මේ දරුවන්ව සොයා යන්න. බොහොම අමාරුවෙන් ගේ සොයාගෙන ගිය අපිට අසන්න ලැබුනේ ඉතාම දුක්බර කථාවක්

මේ දරුවන්ගේ තාත්තා මේ අයව තනිකර ගිහිල්ලා. ආර්ථික අගහිඟකම් නිසා අම්මා ගෘහ සේවිකාවක් ලෙස සේවය සඳහා මැද පෙරදිග රැකියාවකට ගිහිල්ලා. එහි අම්මව නිවෙස් හිමියා හිර කරගෙන. ඒ නිවසේ කරදර නිසා අම්මා පලා ගිහින් අම්මා අද අසරණ වෙලා. මව්පිය සෙනෙහස අහිමි වූ මෙම දරුවන්ව රැක බලා ගන්නේ ලොකු අම්මා. ඒත් ලොකු අම්මා මුදල් උපයා ගන්නේ නිවෙස් වල බැල මෙහෙවර කම් කරලා අපි තීරණය කළා නත්තලේ නාමයෙන් මේ දරුවන්වත් සතුටු කරන්න.

ආදර දුවේ , පුතේ , මේ එක සිදුවීමක් පමණයි. ඔබත් සිතා බලන්න ඔබටත් මෙද නත්තල අසිරිමත් නත්තලක් බවට පත් කළ හැකි ක්‍රියාවක් පිළිබඳව. එවිට ඔබට ජේසුගේ ආදරය වැඩි වැඩියෙන් දිනා ගැනීමට හැකි වේවි.

ජී .ඒ නිමාලි ප්‍රනාන්දු ගුරු මව

සුබ නත්තලක් !

## අපේ නත්තල

ප්‍රවීනා හෂානි ප්‍රනාන්දු
4 ශ්‍රේණිය
ධර්මදූත ළමා සමාජය - දකුණු පයාගල

පුංචි අපේ නත්තල හරිම සුන්දරයි. දෙසැම්බර් මස විසිපස් වන දින බෙත්ලෙහෙම් පුරේ පුංචි ගවලෙනක ජේසුතුමා උපත ලැබීය. එදින සමරමින් අප නිවසේ ගවලෙනක් සහ නත්තල් ගසක්ද ඉතා අලංකාරව සාදන්නෙමු. එම දින දෙමව්පියන්ට හා නෑදෑයන්ට බුලත් අතක් දී සුබ නත්තලක් වේවා යැයි ප්‍රාර්ථනා කරමින් නත්තල බෙදා ගන්නෙමු. මගේ හිත මිතුරන් සමග එක්වී සතුටින් තෑගි බෝග බෙදා ගනිමින්ද, සෙල්ලම් කරමින්ද මා මේ නත්තල ඉතා ප්‍රීතිමත් ලෙස සමරමි.

ඉසුරි සෙව්මිණි
5 ශ්‍රේණිය
ශු. මිඛායෙල් අගුදූත දහම් පාසල
නාගොඩ - කළුතර





භාග්‍ය සල්ගාදු
5 ශ්‍රේණිය
සාන්ත සෙබස්තියන් විදුහල - මොරටුව

## නායකකන්ද මීසමේ සා/ පෙළ විභාගයට පෙනී සිටින ළමෝ ආසිරි ගන්වති.

නායකකන්ද මීසමේ මෙවර අධ්‍යයන පොදු සහතික පත්‍ර සා/පෙළ විභාගය සඳහා ඉදිරිපත් වූ සිසුදරු දැරියන් ආශිර්වාද ගැන්වීමේ විශේෂ මෙහෙයක් දෙව්මැදුරේදී පැවැත්විය. නායකකන්ද මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් විසින් ළමුන්ව ආසිරි ගැන්විය. මෙහිදි ඕනෑම අභියෝගයක් ජය ගැනීම හා ආරක්ෂාව ලබා දෙන ඉතා බලවත් යාච්ඤාවක් දරුවන් අතර බෙදා දෙනු ලැබිනි. **ජූලියන් ගුණවර්ධන**

# ශු. ස්තේවන් මුනිතුමා

සුබ නත්තලක් !



## සුදුවර චරිතයක් හඳුනාගනිමු

ජේසුස් වහන්සේ මරණයට පත්වූ වසරේ ළදරු සභාව ඉතා සීඝ්‍රයෙන් දියුණුවට පත් විය. එවකට 5000 කට අධික ජනකායක් ජෙරුසෙලෙම්හි කිතුනු සභාවට ඇතුලත් වූහ. අපෝස්තුළුවරුන්ට කිතුනුවන්ගේ සෑම කාර්යයක් කිරීමට අවකාශ නොලැබු හෙයින්, ඊට උදව්වක් වශයෙන් යහපත්, භක්තිමත් කිතුනුවන් අතරින් 7 දෙනෙකු තෝරා වගකීම් සමහරක් භාරදී කිතුනුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට පත්කරන ලදී. දේශනා කිරීමටද, ප්‍රසාද ස්නාපනය දනය කිරීමටද අවශ්‍ය වූ විට මුදල් යනාදිය බෙදා දීමට ද ඔවුන්ට නියම වී තිබිණි. ස්තේවන් මේ තනතුරට පත්වූ අයගෙන් කෙනෙකි.

ඔහු තරුණ කාලයේදී අති උතුම් ධර්ම පඬිවරයකු වූ ගමාලියෙල් ගේ ශිෂ්‍යයෙක් විය. ඉතාමත් විශ්වාසවන්ත පරිසිවරයකුට ලැබිය යුතු පූර්ණ අධ්‍යාපනය එම පඬිවරුන්ගෙන් ඔහු ලබා ගත්තේය. ඔහුට ග්‍රීක් භාෂාවේ හසල දැනුමක් ඇති නිසා පලස්තීන පුදෙව්වන් හෙලාදුටු ''හෙලනිස්ත'' කිතුනුවන් අතර සේවය කළේය. ඔහු විශ්වාසයෙන් ද, ශුද්ධාත්මයාණන්ගෙන් ද, වරප්‍රසාදයෙන් ද, දිරිමත් බව්න්ද, පූර්ණ වූ මිනිසෙකි.

ස්තේවන් තුමා අධික ජ්වලිත කමකින් අපෝස්තලික සේවයට කැපවී සිටියේය. දෙවියන් වහන්සේ ඔහුට මහත් පුදුම දේවල් කිරීමට ද බලය දී ඔහු ආශිර්වාද කළ සේක. ඔහු නැවත, නැවත, ''නිදහස් වූ අයගේ යාච්ඤා මණ්ඩ පයේ'' දේශනා කළේය.

ජේසුස් ස්වාමීන් වහන්සේ මෙලොවට පැමිණියේ තෝරාගත් ජනතාව ගලවා ගැනීමට පමණක් නොව, මුළු මහත් ලෝක ජනතාව ගලවා ගැනීමට බව ඉතා නිර්භීතව දේශනා කළේය. පරිසි වරුන්ගේ සිත් දැඩි කම නිසා දීර්ඝකාලයක් බලා පොරොත්තුවෙන් සිටි මෙසියස් තුමා පැමිණි විට උන්වහන් සේව පිළිනොගෙන, කුරුසියේ ඇණ ගසා මරා දැම්මේයයි කියමින් ඔවුන්ට තර්ජනාත්මකව චෝදනා කළේය. ඒ ඇසූ පරිසි වරු ඉතා තදින් කිපී ''ඔහු දේව අපහාස වචන කීවේය'' යි යන චෝදනාව ඔහුට විරුද්ධව එල්ල කිරීමට අන්‍යයන් පෙළඹ වූහ.



ඔහු අල්ලා මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙනයන ලදී. එහිදී ඔහු නිර්භයව දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාවට මඟ පෙන්වූ සැටිද, ඊශ්‍රායෙල් වරුන්ගේ මිත්‍යා ඇදහිල්ල මගින් දෙවියන් වහන්සේට අකීකරුව ගිවිසුම කැඩූ බවද පැහැදිලි ලෙස ඉදිරිපත් කළේය. ඔහු ඉදිරියේ සිටි වධකයන් අමතා මෙසේ කීය. ''නුඹලාද, නුඹලාගේ පියවරුන් මෙන් ශුද්ධාත්මයාණන්ට විරුද්ධව නිතරම ක්‍රියා කරන්නාහුය.'' රැස්ව සිටි ජනතාව මහත් සේ කෝපාවිෂ්ඨව දත්මිටි කෑහ.එහෙත් ස්තේවන් තුමා ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වී ශබ්ද නගා මෙසේ කීය. ''අන්න ස්වර්ගය විවර වී ඇත මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ දකුණු පස නැඟිට සිටිනවා මට පෙනේ'' එකෙනෙහිම ඔහු මහත් ශබ්දයෙන් මොරගසා තමන්ගේ කන් වසාගෙන, එක විට ඔහු පිටට කඩා පැන ඔහු නුවරින් පිටතට ඇද ඔහුට ගල් ගැසූහ.

එතුමා මෙසේ කීය. ''ජේසුස් ස්වාමීන් වහන්ස, මගේ ආත්මය පිළිගත මැනව'' ස්තේවන් යාච්ඤා කරද්දී ඔව්හු ගල් ගැසූහ. ඔහු දණින් වැටී '' ස්වාමීන් වහන්ස , මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව'' යි මහත් හඬින් මොරගසා ස්වාමීන් වහන්සේ තුළ සැතපුනේය. (ක්‍රියා 7:56-57,59-60)

ස්තේවන් ජේසුස් වහන්සේ මෙන් බොරු චෝදනාවලට ගොදුරු වී තම පීඩක යන්ට සමාව දුන්නේය. එතුමා ප්‍රථම ප්‍රාණ පරිත්‍යා ගිවරයා විය. දෙසැම්බර් 26 වන දින එතුමාගේ මංගල්‍ය දිනයයි.

අසේල දසනායක

ළමා ප්‍රදීපය

## සුබ නත්තලක් !



**උද්දේෂි සල්ගාදු**
9 ශ්‍රේණිය
ජයලත් අප ස්වාමිදුගේ
කන්‍යාරාමය - මොරටුව

**ප්‍රබෝධි මහේෂිකා ඈන්**
5 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල - රාජගිරිය





**රවිඳු නවෝද් ප්‍රනාන්දු**
6 ශ්‍රේණිය
ශා.මරියා දහම් පාසල , හපුගොඩ

**නෙත්මි මන්දාකිණි**
4 ශ්‍රේණිය
සාන්ත ජුඩ් දහම් පාසල
ඉදිගොල්ල



**විහංගි මධුකලා**
5 ශ්‍රේණිය
බ/සීවලි නවෝද්‍යා මහා විද්‍යාලය
බණ්ඩාරවෙල



**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.



**ගාර්ඩිනියා වීරක්කොඩි**
1 ශ්‍රේණිය
ශුද්ධ වු කාර්මෙල් දහම් පාසල
බුළුපිටිය

**යතාරා නික්ෂෙලා**
2 ශ්‍රේණිය
සුරදූතික බාලිකා
අපේක්ෂාවේ පාසල - පයාගල



**ක්‍රිෂෙල් ඇන්තනීස්**
5 ශ්‍රේණිය
සාන්ත බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07



සුබ නත්තලක් !

# අසිරිමත් නත්තලක සිරිය විඳින්නට නම්...

අසිරිමත් නත්තලක සිරිය විඳින්නට නම් අප සමිඳුණන්ගේ උපත සිහි කරන්නට සැරසෙන මේ මොහොතේ ''මෙලොව සුසිත් ජනයින් හට සාමය හිමි වෙන්නට'' ආසිරි ගී ගැයූ සුරිඳු කැළ



සිහිපත් වෙනවා නො අනුමානය. පවින් මුදවා අප සැම හට සාමය සෙත සලසන්නට මෙලොවට වැඩි ජේසු බිලිඳුන් හට ගෞරවාන්විත ලෙස අභිමානය දැක්වීමට නම් ළමා ඔබේ සිතට මෙන් ගතට සිසිලක් , ප්‍රාණයක් , ජීවයක් දෙන්නට කුඩා ඔබ සැරසී සිටිය යුතුය. එය ලබාගත හැක්කේ සමිඳුගේ දෙව් වදන් පිළිගැනීමෙනි. ඒ අනුව යමින් දහමට එළියක් දෙමිනි.

ශ්‍රී ශුභ නත්තලක් වන්නට අප එකිනෙකාට සුභ පතන්නේත්, ආසිරි පතන්නේත් නත්තලට පෙර සූදානමකින් විය යුතුය. ''සාමයේ කුමරු'' වඩින්නට අප හදවත් තුළ ලැගුම් ගන්නට



නම් නත්තලට පෙර යහපත් නිර්දෝෂී පාපොච්චාරණයක් කොට පවින් නිදෙස් වීමෙන් , අප නිවෙස්වල තීන්ත ආලේප කොට , මකුනු දැල් කඩා ශුද්ධ පවිත්‍ර කරන්නා සේ හදවතේ ඇති මකුනු දැල් කඩා දමා, දුවිලි පිස දමා, පාපොච්චාරණය නැමති ශුද්ධවූ ආසිරියෙන් තීන්ත ආලේපනය කොට නව විලාසිතා වෙන් හෙබි අලුත් ඇඳුම් පැලඳුම් වෙනුවට ලෝබය , කෑදරකම තෘෂ්ණාව, අසමගිය, අහංකාරකම ඉවතලා අපි එකිනෙකාට සහෝදරත්වයෙන් ඇති හැකි අයුරින් බද ගෙන කනවාට වඩා බෙද ගෙන කෑම, සමගිය, සමාදනය නැමති අලුත් සළු පොරවා ගන්නේනම් නත්තලේ සැබෑ අරුතට කොටස් කරුවන් ලෙස පෙනී සිටින්නටත්, ජේසු බිලිඳුන්ගේ ආදරය, කරුණාව, සෙනෙහස මෙන්ම ආශිර්වාදය ලබන්නට අපිට ඇති එකම සුදුසු කම සපුරා හමාරය. එසේ වුවහොත් පමණි ළමා ඔබට තවත් අයෙකුට සාමය පිරි සමෘධිමත් නත්තලකට ආසිරි පැතීමට හැකිවෙනුයේ. ළමා ඔබ සැමට එලෙසම ඉටු කර ගත හැකි සමෘධිමත් නත්තලක් වේවා !

**සටහන සහ සිතුවම**
**ජුඩ් ජේ. ප්‍රනාන්දු මාමා විසිනි**

මාසික සිතිවිල්ල



**මාසික සිතිවිල්ල**
“දෙසැම්බර් මාසය” ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.




# ප්‍රහේලිකා අංක 35



සැකසුම

තිළිණි
දුතිකා
පෙරේරා

හරහට

1. මංගලම් කීමට පැමිණි ගාබ්‍රියෙල් දේවදූතයාට මරිය තුමිය පැවසුවේ ''බලන්න මම ස්වාමින් වහන්සේගේ ..... වෙමි. ඔබ පැවසූ ලෙස මට සිදු වේවා'යි යනුවෙනි. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. ........... වරදවා ගැනීම , පය ලිස්සා වැටීමට වඩා අයහපත්ය'' යනුවෙන් උපදේශකයා හෙවත් සිරාක් පවසයි.

4. මරියතුමියගේ උදන ගීතයේ මෙසේ සඳහන් වේ. සමිඳාණෝ මහා නරපතීන් සිය සිහසුන්වලින් ....හෙලා දීනයන් ඉහළ නංවා උසස් කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ක්‍රිස්තුන් වහන්සේ සුවකළ ලාදුරු රෝගීන් දස දෙනාගෙන් උන්වහන්සේට ස්තුති කිරීමට නොපැමිණි සංඛ්‍යාව

7. මෙහි ඉඩකඩ නොමැති වූයෙන් ජේසු බිළිඳුගේ උපත සිදු වූයේ ගවලෙනකය.

පහළට

1. මරිය තුමිය දේව මාතාවන් ලෙස තෝරා ගන්නා විට එතුමිය .....රජ පරපුරෙන් පැවත එන ජුසේතුමා හට විවාහ ගිවිසුම් දී සිටියාය. මෙහි හිස්තැනට සුදුසු වචනය

2. මරිය තුමියගේ උදන ගීයේ මෙසේ සඳහන් වේ සමිඳාණන් සාගිනි වූවන්.... දෙයින් සතප්වා ධනවතුන් හිස් අතින් හරවා යැවූ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය

3. ස්නාවක ජුවාම් තුමාගේ එක් දේශනයකදී මෙසේ ප්‍රකාශ කළේය. ....... හොඳ හැටි පිරිසිදු කරන පිණිසත් ධාන්‍ය පෙළා සිය අටුවෙහි රැස්කරන පිණිසත් ක්‍රිස්තුන් වහන්සේ අතේ කුල්ල ඇත. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ස්නාවක ජුවාම් තුමා උපදින විට සකරියස්තුමා ගොළු ව සිටිය බැවින් තම පුත්‍රයාට දිය යුතු ......... ගල්ලෑල්ලක ලියා පෙන්වූ බව ශු. බයිබලයේ සඳහන් වේ. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. අප ලෝකයේ ආලෝකය විය යුතු බවත් මිනිස්සු පහනක් දල්වා බඳුනක් ..... නොව පහන් රුකක් මත තබා සියල්ලන්ට එළිය ලබා දෙන බව ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක.

(මෙම ප්‍රහේලිකාව පිරවීමේදී පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලූක් 1,2,3,4, 17, 19, උපදේශකයා හෙවත් සිරාක් 20, ශු. මතෙව් 5 )




## නාත්තන්ඩිය ලූර්දු මාතා දහම් පාසල



පසුගියද නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ 8 ශ්‍රේණියේ දහම් දරු දැරියෝ පොළක් පැවැත්වූහ. මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමාගේ අනුදැනුමින් පැවති මෙය වර්ෂ අවසාන නත්තල් උළෙල හා තෑගි බෙදා දීම සඳහා වියදම් උපයාගැනීමට සංවිධානය කෙරිණි. මීට පංතිභාර දහම් ගුරුවරුන්ගේ නොමද සහය ලැබිනි. **ශ්‍රීයාංගණී ෆිලීෂියා**

## දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසල



දියලගොඩ සාන්ත සෙබස්තියන් දහම් පාසලට ආධාර පිණිස දහම් පාසල් දරු දැරියන් විසින් සංවිධානය කරන ලද පොළක් පසුගියද දියලගොඩ දෙව් මැදුර අභියසදී පැවැත්වුනි.

මීසම් සේවක ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමන්ගේ අනුශාසකත්වයෙන් හා දහම් ගුරුවරුන්ගේ සහයෝගයෙන් මෙම කටයුතු සංවිධානය කෙරිණි. ගරු පියතුමන් විසින් පීත්ත පටිය කපා පොළ විවෘත කළ අයුරු මෙහි දිස්වේ. **ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 35, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.


රජ කුමාරයයි සිඳුරැ කුමාරියයි
27
ඔව් කුමාරී.. අපි ආපු නැව විනාශෙ වුනාට පස්සේ මට මොනව උනාද කියලා හිතාගන්නවත් බෑ. මට ආයිමත් සිහිය ඇවිත් බලන කොට මේ පුංචි මාළිගාවෙ ඇඳක් උඩයි හිටියේ....
හැමදාම රෑ වෙන්න එන වෙලාවට මම මේ මූද අයිනට වෙලා එළි වෙනකං බලාන ඉන්නවා.. කුමාරියි සිඳුරියෝ ටිකයි එනකං
ඒ වුනත් ලොකු රත්තරං පාට මාළු රංචුවක් ඇවිත් රෑ.. එළි- වෙනකං සිංදු කියනවා.. ඒ ගොල්ලො තමයි මගෙ පාළුව ටිකක් හරි මග අරින්නෙ..
ඒ ගොල්ලො එළිය වැටීගෙන එනකොට ආයෙත් මූදෙ ඈතටම යනවා හරි පුදුමයි. ඒ වගේම තමයි කුමාරි මුං නැව විනාශෙ උනායින් පස්සෙ අතීතයේ වෙච්ච කිසිම දෙයක් මතක නෑ.. දවසාර වෙලාවට මතක් වෙන්න ඇවිත් ආයෙත් අමතක වෙනවා..
ඕන්න මය විදිහට තමයි කුමාරි මගේ ජීවිතේ ගතවුනේ දවල්ට කාලා, බීලා හිටියත් රෑට හරිම පාළුයි.. මයෙ සිඳුරියෝ කට්ටියයි ඇවිත් රෑ එළිවෙනකං සිංදු කියලා විනෝද වෙනව වගේ නෑ
ඒ දෙන්නා කතා කර කර ඉන්නකොට වෙලාව යනවා දැනුනේ නැහැ.. දැන් එළිං හෝඩිමට ඉර එළිය වැටීගෙ-න එන නිසා කුමාරිට සිඳුරු විමානෙට යන්න ඕනැනෙ..
සිඳුරැ කුමාරි කුමාරයගෙන් සමුගත්තෙ බොහොම අකාර- වෙන්.. දැඩි ශෝකයෙන්. කුමාරයට ත් එහෙමමයි.... හැමවිටම සතුටක්.. වගේම.. වෙන්වීම හරිම දුකක්.... කුමාරය.. කුමාරියි මනුතාරියගෙ දුවයි.. ඈත ඈත මුහුදෙ නොපෙනී... යනතුරුම හුනක් බලාගෙනවුවෙන්...
—වැඩි සිටියා—

**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ**
**කතාව**

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම -
ආමල් ද සිල්වා -

**05**



# ළමා අපිත් සැබෑම ගවඔරුවක් වෙමු.

සුබ නත්තලක් !

```"උඳුවප් මාසයේ පින්වත් දිනයක
සීතල මැදියම් රාත්‍රියේ
මවක් තුරුළු කර උන්නේ කව්රුද?
කියා එදා කිසිවකු නොම දන්නේ......
ගවයන් මැද තම පොඩි පුතු සතපා
එහි අර්ථය ලොවටම පෑවේ
එදා පුංචි ඒ බිලිඳාණන්
වෙන කිසිවෙකු නොව අපේ ජේසු කුමරුයි........"

"සමිඳාණන් වහන්සේම නුඹලාට ලකුණක් දෙන සේක, බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහි කරන්නීය" යෙසායා දිව්‍යප්‍රසාදිතුමා එදා සිටි දේව ජනතාවට උතුම් අනාවරණයක් එලෙසින් දුන් සේක. ඒ අනාවරණයේ සාක්ෂිය නම් සර්වබලධාරී දෙවිපියාණන්ගේ ඒකජාතක පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මිනිසත් බව ගෙන මෙලොවට වැඩම කිරීමයි. එම අති උත්කෘෂ්ඨ අනාවරණය ශුද්ධ වූ සභා මාතාව නත්තල් මංගල්‍යය ලෙස සමරනු ලබයි.



ශු. ලූක් සුභාරංචියට අනුව ගාබ්‍රියල් දේවදූතයා මරිමවින්ට පැවසුවේ තමා පිළිසිඳගත් පුත්‍රයාට "ජේසුස් "කියා නම් තබන ලෙසය. මෙසේ ඇයට මංගලම් කීම සිදුවූයේ ජේසුස් වහන්සේව මෙලොවට ජනිත කරවීමේ උතුම් තැනැත්තිය ඇය බව සකල ජනතාවටම ප්‍රකාශ කර සිටීමටය. ඒ උත්තම වූ මාතාව එනම් අප ආදර අම්මා දේව පුත්‍රයාණන් මෙලොවට ජනිත කළේ උඳුවප් මස එක් පින්වත් දිනයක මැදියම් රාත්‍රියේදීය. ඒ දෙසැම්බර් 24 වන දිනයි.

'තවද , ඔවුන් එහි සිටියදී ඇගේ ප්‍රසව කාලය සම්පූර්ණ විය. ඇය කුළුඳුල් පුත්‍රයා බිහිකොට රෙදිවලින් ඔතා තානායමෙහි ඉඩකඩ නොතිබුණු බැවින්, ගව ඔරුවක බෑවුවාය" මෙසේ සුවිශේෂක කතුවරයා අපට පවසා සිටින්නේ,උන්වහන්සේට මෙලොව ජනිත වීමට සුව පහසු රෝහල් වල ඉඩකඩ නොතිබූ බවයි. ඒ වෙනුවට ජේසු බිලිඳාට උරුම වුයේ ගව ඔරුවකි. නමුදු අති උත්තම මරියොත්තමාවෝද , ජුසේ තුමාද, සමඟ තම පුංචි පුතුව රැකබලාගෙන සිටියේ එකී පිළිසිඳගැනීමේ සැබෑ අරුත වෙන කිසිවක් නොව දේව කැමැත්තට බව අර්ථ ගන්වමිනි. දෙවියන් වහන්සේගේ කැමැත්ත තුළින් ලොවට කියාපාන්නේ එනම් බිලිඳුගේ දිළිඳු උපත මගින් පෙන්වා දෙන්නේ ව්‍යංගාර්ථයෙන් හෙබි කරුණු ගොන්නකි.

මෙහි ගවමඩුව යනු, මිනිසාය. සෑම ආරම්භයකටම කාලය අවකාශය තනන්නා සේම සෑම මියැදීමකටම ආරම්භයක් ඇති වන්නා සේම උන්වහන්සේගේ උපතින් ගං මෝය තුළ චමත්කාරය තැන්පත් කරන්නා සේ මිනිස් හද තුළ මහ අරුම පුදුම දෙයක් තැන්පත් කළේය. ඒ මන්ද ගව මඩුව ගවයන්ට සෙවණ සපයන්නා සේ ලෝකයේ පහළම තත්ත්වයේ වාසස්ථානයකි. මිනිසාගේ ජීවිතයද එලෙසමය මන්ද මිනිස් ජීවිතයට ප්‍රශංසා, ගරු නම්බුව පමණක් නොව ගැරහුම් , අපහාසද එල්ල වන බැවිනි. ගව මඩුව යනු, අප නම් අප තුළ ගව ඔරුවක් තිබිය යුතුය. ඒ හදවත නමැති ගව ඔරුව සැමවිටම ජේසුස් වහන්සේට සූදානම් කර තැබීම අපගේ යුතුකමකි.

> නත්තලේදී ජේසු බිලිඳුන් අප තුළට වඩිනුයේ අප සතු ගව ඔරුව නමැති හදවත සුදානම් කර තබාගතහොත් පමණි. ගෙවී ගිය කාලය තුළ අප යහපත් ජීවිත ගත කරමින් උන්වහන්සේට ලැගුම් ගන්නට ආරාධනා කරමින් අප හදවත් ගව ඔරුවක් බවට පත් කරන්නට උත්සාහ ගත්තේ නම් මෙවර නත්තලේදී අප තුළටද ජේසු බිලිඳුන් වඩිනු නොඅනුමානයි.

නත්තලේදී ජේසු බිලිඳුන් අප තුළට වඩිනුයේ අප සතු ගව ඔරුව නමැති හදවත සුදානම් කර තබාගතහොත් පමණි. ගෙවී ගිය කාලය තුළ අප යහපත් ජීවිත ගත කරමින් උන්වහන්සේට ලැගුම් ගන්නට ආරාධනා කරමින් අප හදවත් ගව ඔරුවක් බවට පත් කරන්නට උත්සාහ ගත්තේ නම් මෙවර නත්තලේදී අප තුළටද ජේසු බිලිඳුන් වඩිනු නොඅනුමානයි.

**කේ.ඒ. නිම්නාදි රොද්‍රිගෝ**
11 ශ්‍රේණිය - සිරිකුරුස විදුහල - ගම්පහ



**රොෂෙල් නවෝද්‍යා පෙරේරා -** 4 ශ්‍රේණිය
ශා. ජුඩ් දහම් පාසල - වැල්ලබඩ , (බෝපිටිය මීසම )
```



සුබ නත්තලක් !

# නත්තලේ සැබෑ අරුත

නත්තල කාටත් ප්‍රීතිය ගෙන දෙන වචනයක් , එය කාටත් දුකක් දොම්නසක් ගෙන දෙන වචනයක් නොවේ. එක්තරා පුද්ගලයෙක් සතුටින් සිටින විට අපි අහනවා ''ඇයි මොකද? මේ.. අද නිකං මෙයාට නත්තල් වගේනෙ '' නත්තල සැබෑ ලෙසම ප්‍රීතියක් ගැලවීමක්, සාමයක් ගෙන දෙන්නක් , නමුත් නත්තල සැබෑ ලෙසම තවත් එතෙර වීමක්ද?

එතෙර වීම යන වචනය ප්‍රධාන වශයෙන්ම අපට හමුවන්නේ ශු. බයිබලයේ නික්මයාම සිද්ධිය තුළය. මිසර වැසියන් පාරාවෝගේ වහල් සේවයෙන් මිදී මෝසෙස් තුමන්ගේ නායකත්වය යටතේ රතු මුහුද තරණය කර පොරොන්දු දේශය හිමි කරගැනීමේ සිද්ධිය අපි කවුරුත් එතෙරවීම ලෙස සරල වශයෙන් දන්නා කරුණකි. නමුත් මෙහි දේව ධාර්මික සංකල්පය ඊට හාත්පසින්ම වෙනස්ය. මිනිස් ජීවිතයේ කටුක අත්දැකීම් ඔස්සේ දෙවියන් වහන්සේගේ ඉමහත් ප්‍රේමය අත්දැකීම යන්න මෙහි දේව ධාර්මික සංකල්පයයි.



නත්තල ලෙස අප අරුත් ගන්වන්නේ කුමක්ද? ජේසු බිළිඳු ගේ උපත දෙසැම්බර් 25 පමණක් සැමරීමක්ද? මෙය සැබෑ ලෙසම නත්තල යැයි කිව නොහැකි ය. මෙය වූ කලී අර්ථ ශුන්‍ය ක්‍රියාවකි. ශුද්ධ බයිබලීය දැක්මට අනුව ශුද්ධවර මතෙව් තුමාද ජේසු බිළිඳු උපත සමාන කරන්නේ ද නව එතෙරවීමකටය. එනම් ජේසු බිළිඳු උපන් මොහොතේ හෙරෝද් රජු කුළුඳුල් ළදරු ඝාතනයන් සිදු කළ අතර මෙම අවස්ථාවේදී සිහිනයකින් දර්ශනය වූ දේව දූතයාගේ කීම පරිදි ජුසේ තුමා බිළිඳු හා මරියතුමියවද එක්ව පලා ගිය අතර මෙයද දේව සැලැස්ම තුළ එක්තරා වූ එතෙර වීමකි. මෙම ගමන තුළදී ඔවුන් සැබෑ ලෙසම දේව ප්‍රේමය අත්දුටහ.

නත්තල වශයෙන් අප බාහිරව දකින්නේ සතුට, සාමය, ප්‍රීතියයි. සැබෑ ලෙසම අප නත්තල තුළ මෙම සතුට , ප්‍රීතිය , සාමය සෙවිය යුත්තේ එතෙර වීමේ අත්දැකීම තුළය. ''අනේ මගේ දරුවන්ට මේ නත්තලේවත් මොනවාහරි අරන් දෙන්න අතේ පිච්චියක්වත් නැතැයි'' කියා හූල්ලන තාත්තලා කී දෙනෙක් ඔබ මම ජීවත් වන සමාජයේ සිටින්නට පුළුවන. නත්තල සැබෑ ලෙසම අතේ මුදල් ගැවසෙන පුද්ගලයාට සෑම දිනකම නත්තල් වගේ. මේ සමාජයේ කීයමනකි. නමුත් දුගී පැල්පතේ දුක්විඳින අසරණ අම්මගේ, තාත්තගේ , දරුවන්ගේ පුංචි පැල්පතේ නත්තල ලබන්නේ දෙසැම්බර් 25 විතරද? නැහැ මේ දුගී පැල්පතේ තමයි හැමදාම නත්තල්, හැමදාම ජේසු ඉපදෙන්නේ මේ දුගී පැල්පතෙයි. ඒ මන්දයත් එම පැල්පත දිළිඳු වුවද ඔවුන් දුක් කරදර කම්කටොලු ඔස්සේ අත්දකින දේව ප්‍රේමය සැබෑ නත්තලයි. නත්තල සැබෑම ලෙස එතෙරවීමක්ද? යන්න ප්‍රශ්නාර්ථයක් නොව නත්තල සැබෑ ලෙසම එතෙර වීමකි. නත්තල් කියන්නේ අතේ සතේ නැහැ කියලා හූල්ලන අම්මේ තාත්තේ තව සැරයක් ජේසුව ගවලෙනක පිදුරු ගොඩේ උපදින්නට සලසන නත්තලක් නොවේ. සැබෑ ලෙසම දුක් කරදර ඔස්සේ අත්දකින දේව ප්‍රේමය තුළ අප හදවත් තුළ උපදින්නට ගොඩනඟන නත්තලකි. ඉතිං මේ නත්තලේදීවත් අප හදවත් ජේසුගේ ආදරය, ජේසුව උපදින්නට හැකි හදවතක් වෙනවානම්.

**ක්‍රිෂාන් රංගන තමෙල්** - *13 ශ්‍රේණිය*
ශාන්ත පාවුලු දෙව්සත්හල - මාරවිල

# එඬේරු සහ දේවදූතයෝ

*එදා රාත්‍රියේ බෙත්ලෙහෙම් පුරේ තණ පිටියේ*
*බැටළුවන් රැක බලමින් සිටි එඬේරුන්ට දේවදූත කැළ*
*ඒකරාශි වී මැදියම් රැයේ නිහැඬියාව ගීයෙන් නින්නාද කළේ,*
*"දෙවිඳුන්ට මහිමයත්, සුසිත් දනට සාමයත් වේවා යන්නයි."*
*මෙය ඇසූ එඬේරු බියපත් වූහ. එවිට දේව දූතයා කතාකොට*
*'බියනොවන්න, මම ඔබටත් මුළු ජනතාවටත් මහත් සතුටුදායක පුවතක් ගෙනෙමි.*
*එනම් ගැළවුම්කාරයාණෝ දාවිත්ගේ නුවර*
*අද උපන්නාහ. එතුමා සමිඳාණෝය. උන් වහන්සේ රෙදිවලින් ඔතා*
*ගව ඔරුවේ හොවා සිටින සේකැ"යි කීය.*

*එවිට එඬේරු "ස්වාමින් වහන්සේ අපට දන්වා වදාළ මේ*
*සිද්ධිය බලමු"යි ඔවුනොවුන් අතර කතාකර*
*ගත්හ. ඔවුහු යුහුව ගොස් මරියා ද, ජෝශප් ද, ගව ඔරුවක*
*සතපවා උන් බිළිඳා ගැන කී සියල්ල අන් අයට විස්තර*
*කළහ. ඒ ඇසූ සියල්ලෝ මවිත වූහ. මරිය තුමී*
*සියල්ල සිතේ තබාගෙන මෙනෙහි කළාය.*

**ශෙහානි ඈන් සමරතුංග**
*ධර්මදූත ළමා සමාජය*
**දකුණු පයාගල**



# කෙටි කතාව

සුබ නත්තලක් !

# තෙරේසාගේ නත්තල

**හංසනී දිල්හාරා පෙරේරා**
මට්ටක්කුලිය



ටිං... ටිං.... ටිං.... අන්න අම්මේ
පල්ලියේ දෙවෙනි සීනුවත් ගහනවා.
යන්නේ නැත්ද? පොඩ්ඩක් හිටහන් මේ
මං ලෑස්ති
වෙනවානේ අම්මා දැන් කොයි
වේලාවේ ඉඳන්ද ලෑස්ති වෙන්නේ
අද නත්තල් පූජාව අදවත් කලින්
යන්න එපැයි. හරි හරි
කෑ නොගහා ඉඳින් (දොරට
කිසිවකු තට්ටු කරනු ඇසේ.)
අරලිය , අරලියා සිරියලතා
නැන්දේ ආ නිර්මලි පල්ලි
යන්නද? ලස්සන ගවුමක් ඔව්,
ඔයාගේ ගවුමත් ලස්සනයි. පල්ලි
යන්නේ නැත්ද? යමු යමු අම්මා තාම ලෑස්ති වෙනවා.

කුසුමාවතී නංගියේ, ඇයි? තෙරේසා අක්කේ
අපේ කෙල්ලව එක්කන් යන්න. මී පූජාව පටන් ගන්නත් ළඟයි නේ
මං එන්නම්, හා අම්මේ එහෙනම් එන්න මං යනව
(පූජාව පටන් ගනී) කෝ නිර්මලී අම්මා තාම නෑනේ''
අරලියා පැවසුවාය. ඇවිත් ඇති මේ සෙනඟ අස්සේ
අපිව හොයා ගන්න බැරිව ඇති. පූජාව ඉවරවුනාම බලමු.
හ්ම් ...(පූජාව අවසන් වේ)

දෙදෙනා දේවස්ථානය පුරාම අරලියාගේ මව සොයන්නට
පටන් ගත්තෝය. එහෙත් සොයා ගැනීමට නොහැකි විය.
නැන්දේ අම්මා නෑනේ අපිව හොයාගන්න බැරි වෙලා
ගෙදර ගියාද දන්නේ නෑනේ.අපි ගෙදර ගිහින් බලමු.
අම්මා දන්නවානේ දු මා ළඟ කියලා (නිවසට පිටත් වේ)
අයියෝ දොර වහලනේ පල්ලියෙත් නෑ නේ,
අපි බලමු තව ටික වේලාවක්,
නැත්තම් අපේ ගෙදර යමු. (පැය දෙකක් ගතවිය)
නැන්දේ අර කවුද එනව. වගේ මේ වේලාවේ කවුද?
පූජාවට ගිය හැමෝම ගෙවල්වල නේ මේ වේලාවේ හ්ම්
ආ. මේ සිරියලතා නේ අම්මේ ඇයි මොකද වුනේ,
ඇයි පල්ලි ආවේ නැත්තේ
පොඩ්ඩක් හිටහන් හා කුසුමාවති ඇවිත් ඇඳී ගන්නකො
ඇයි අක්කේ පූජාවට ආවේ නැත්තේ එන්න තමා හිටියේ ,
දොර වහනකොටම අර පහළ ගෙදර පොඩි කොලුව
අඬාගෙන ආවා අම්මට සනීප නෑ කියලා
ඒ පාර මං කොලුවා එක්ක ගියා ළමයෙක් හම්බවෙන්න
නේ හිටියේ බැලින්නම් හොඳටම අමාරුයි
ඒ පාර මං කොලුවා සිරිදාසගේ ගෙදරට යවලා
ත්‍රිවිල් එක ගෙන්නගත්තා සිරිදාස ඉතින් අපිට හිතවත්
එකානේ ඕන්න ඉතින් ඉස්පිරිතාලේට ගෙනිච්චා
කියන්න කුසුමාවතියේ පුංචි කොලු පැටියෙක් අනේ
ඒ අම්මාට වඩා කඳුළු ආවා මට ඒ පොඩි එකාව දැකලා
අද වගේ හොඳ දවසක පල්ලිවත් යන්න වුනේ නෑ
මට ඒත් පූජාවට ගියා වගේ තමා
ඒ කොලු පැටියා මගේ අතට ගන්නකොට දැනුනේ.

අනේ තෙරේසෝ පල්ලි නාවට කමක් නෑ
එදා අපේ ජේසු ලැබෙන්න හිටිය
මරිය අම්මට යන්තම් හරි පිහිටක් වුනේ
ගවමඩුවේ අයිතිකාරයා.
ඒ වගේ තමා ඒ අම්මගේ උදව්වට හිටියේ අක්කා
ඒක කොච්චර වටින දෙයක්ද ......



**තෙන් කැලුම්** - 6 ශ්‍රේණිය
මාරිස්ටෙලා විදුහල - මීගමුව






# නත්තල් ළමා කතාව

## සුබ නත්තලක් !

ඩෝන් පටෝං ඩෝං ඩෝං ගම පුරාම රතිඤ්ඤා හඬ. ඇයි දන්නවාද? නත්තල් ළඟයිනෙ. පාසල් නිවාඩුව නිසා ගමේ ළමයි, හරිම ප්‍රීතියෙන් සෙල්ලම් කරනවා . නත්තල පිළිගන්න මුළු ගමම ලෑස්ති වෙනවා. ගමේ පල්ලිය සුදු හුණු ගාලා බලන්න ලස්සනයි. ගෙවල් දෙරවල් පිරිසුදු කරලා , අලුත් දෙර ජනෙල් රෙදි දමලා කිරිබත් පිසින්න අලුත් වළං ගෙනැල්ලා ගමේ උදවිය බලන් ඉන්නේ නත්තල් එනකල්.

ඒත් ලසන්තගේ ගෙදර නම් පරණ විදියමයි. ලසන්ත ගමේ ඉන්න දුප්පත් ළමයෙක්. ලසන්තයි අම්මයි වාසය කරන්නේ කුඩා කටු මැටි ගෙයක. වහලයට පොල් අතු. ලසන්තගේ තාත්තා එයා කුඩා කාලයේම මිය ගිහින්. අම්මා කුලී වැඩ කරලා උපයන මුදලින් තමා මේ දෙන්නා ජීවත් වෙන්නේ. එද වේල සොයා ගන්නෙත් බොහෝම අමාරුවෙන්.

පුංචි ලසන්ත හුඟාක් හොඳ ළමයෙක් අම්මාට හරිම ආදරෙයි. හැකි සෑම විටම අම්මාට ගෙදර වැඩවලට උදව් වෙනවා. ලිඳෙන් වතුර ඇදලා දෙනවා.දර එකතු කරලා දෙනවා. කෑම පිසින්න පවා අම්මාට උදව් වෙනවා. කොතෙක් අඩු පාඩු තිබුණත් ඉගෙනීමේ කටයුතුත් ලසන්ත හොඳින් කරනවා. කම්මැලි නැහැ.

ඔන්න නත්තල් දවස කට ළඟටම ඇවිල්ලා. හෙටයි නත්තල. පුංචි අය හරිම සතුටින් සෑම ගෙයකම පාහේ නත්තල් ගසක් හදලා බැලුම් එල්ලලා දිස්නෙ ගහන පාට පාට සැරසිලි කොළ එල්ලලා බලන්න ආසයි. සමහර ගෙවල් වල විදුලි බුබුළුත් එල්ලලා ගම්මානයම සිරියාවෙන් පිරිලා. ‘‘අනේ අම්මේ මේ පාරනම් නත්තලට කොහොම හරි නත්තල් ගහක් හදන්න ඕනෑ. ගිය සැරෙත් බැරි උනානේ. පුංචි ලසන්ත අම්මාට ඇවිටිලි කරන්න වුනා. ඔව් මගේ රත්තරන් පුතේ මේ පාර පුතාට මං ලස්සන නත්තල් ගහක් හදලා දෙන්නම් කෝ. අම්මා පුතාව සැනසුවා.

ලසන්තගේ අම්මා කලින් දිනයක ඉතිරි කරගත් මුදලින් බැලුම් බෝල කිහිපයකුයි, පාට කොළ වගයකුයි , ගෙනැල්ලා හංගලා තියලා. අලුත් ඇඳුමකුත් මහලා නත්තල් දිනයට පල්ලි යන්න. ලසන්ත මේ කිසිවක් දන්නේ නැහැ.

ලසන්තගේ ගෙදර එහා වත්තේ ඉන්නේ හරිම පෝසත් මුදලාලි කෙනෙක් විශාල වත්තක් මැද ලොකු ගෙයක් ඒ ඉඩමේ තියෙනවා. ඉතාම සරුවට වැඩුනු නත්තල් ගස් කිහිපයක්. මුදලාලිගෙන් මේ වතාවේ නම් නත්තලට අත්තක් ඉල්ල ගන්න ඕනෑ. ගමේ අනිත් ළමයින්ට වගේ මගේ පුතාටත් ආස ඇතිනේ නත්තල් ගහක් හදන්න අම්මා හිතුවා.

අම්මා එද පාන්දරින්ම දවල් කෑම පිළියෙළ කළා. ගෙදර වැඩ සියල්ල අහවර කරලා, ගියා මුදලාලි හමුවෙන්න. සමහර දවස්වල, මුදලාලිගේ ගෙදර වැඩවලටත් ලසන්තගේ අම්මා උදව් වෙනවා. මුදලාලිගේ නිවසේ සාලයේ අලංකාර නත්තල් ගසක්, කදිමට සරසලා පුංචි තාරකා වගේ දිලිසෙන විදුලි බුබුළු. මුදලාලි හාමිනේ ඈත තියාම දැක්කා ලසන්තගේ අම්මා එනවා ඇලිස් උඹ ආව එක හොඳයි නත්තලට කැවිලි ටික හද ගන්නත් එක්ක‘‘ අනේ හාමිනේ මම මේ ආවේ නත්තල් අත්තක් ඉල්ල ගන්නයි, පොඩි එකාගෙන් බේරිල්ලක් නැහැ. නත්තල් ගහක් හදලා දෙන්න කියලා. ඇලිස් බැගෑපත් ලෙස කියා සිටියා. ඇලිසෝ මුදලාලි ඉස්සරහ පැත්තේ කථා කරල බලපං. ඇලිස් පිළිකන්න පැත්තෙන් ගෙයි ඉස්සරහට ගියා. මුදලාලි පත්තරේ බලනවා. ඇලිස් ටිකක් එහාට මෙහාට කැරකුනා අහන්න සැකයි වගේ.

මුදලාලි මහත්තයෝ කොලුවාට නත්තල් ගහක් හදන්න අත්තක් ඉල්ල ගන්නයි ආවේ’ ඇලිස් උඹ පරක්කු වෙලා වැඩියි. ඊයේවත් ආවනම් දෙන්න තිබුණා. වත්තේ තියෙන නත්තල් ගස් ඔක්කොම සිදදියේ වෙළෙන් දෙකුට පොරොන්දු වෙලයි තියෙන්නේ අතු කපන්න. මෙලහකටත් එනවා ඇති. මුදලාලි එක දිගට වැලක් වගේ කියාගෙන ගියා. පිංසිද්ධ වෙයි. මුදලාලි මහත්තයෝ පොඩි අතු කැල්ලක් හරි දෙන්න පුතා බලාගෙන ඉන්නවා. මං එනකන්. පොරොන්දු වෙච්ච වචනය අහක දන්න බෑනේ එක අත්තක් හරි පිටට ගියොත් ඒක හරි නැහැ.

මුදලාලි කල්පනා කළේ නත්තල් ගස් වලින් ලැබෙන සල්ලි විතරයි. එක අත්තක් හරි නිකං දෙන්නේ මොකටද? ඇලිස්ගේ හිතට හරිම දුකයි ඇලිස් ආපසු හැරුණා පුතාට ඇත්තම කියනවා. ගෙදර ගියා පුතාට සියළු විස්තර කියුවා. ලසන්තටත් හරි දුකයි. ඒත් අම්මා කනගාටුවෙයි කියලා කඳුළු සලන්නැතුව හිටියා. පුතා නිදගත්තට පස්සේ බැලුම් බෝල එල්ලලා අලුත් ඇඳුම් පුතාගේ පැදුර ලඟින් තියනවා. අම්මා හිතුවා. මුදලාලි කියපු විදිහට සිදදියේ වෙළෙන්ද ලොරියකින්



**න**
**ත්**
**ත**
**ල්**

ඇවිත් නත්තල් ගස්වල අතු කපන්න පටන් ගත්තා. ලසන්තගේ වැට ළඟ ගහටත් ආවා මේ ගහේ අතු වලට වැඩි ගානක් ඕනෑ මුදලාලි කිව්වේ සන්තෝසයෙන්. කෙනෙක් ගසට නැගලා ගසේ අතු සියල්ල කපලා බිමට හෙළනවා ලසන්න බලා ගෙන හිටියේ හරිම කම්පාවෙන් ඔහුගේ පුංචි ඇස් දෙකට උනාගෙන ආ කඳුලු නවත්වා ගත්තේ හරිම අමාරුවෙන්. මේ අතර සිදු වූ දෙය එතැන සිටි කිසිවෙක් දැක්කේ නැහැ.

සුබ නත්තලක් !

## තෑග්ග



ගසේ මුදුන් අත්ත කපලා බිමට දන කොට ගස දෑත දිගු කරලා වගේ අත්ත බදගෙන බඳට තදකර ගත්තා කිසි කෙනෙකුට නොපෙනෙන්න. ගනු දෙනුව නිමවී මුදලාලි ලැබුණු කාසි ගනිමින් ගෙතුළට ගියා. වෙනද වගේම එදත් ගමට රාත්‍රිය ආවා. පුංචි පුංචි තාරකා අහස පුරාම හරියට දියමන්ති කැට වගේ. සීතල නත්තල් සුළඟ ගම හරහා හමා ගෙන යනවා. වගේ. පුතා ලසන්ත එන්න කෑම කන්න'' පිල උඩ වාඩි වී සිටි ලසන්තට අම්මා අඬ ගැසුවා.

පුතා ඉක්මනට කෑම කාලා නිදගන්න හෙට උදේ පල්ලි යන්න තියෙනවානේ. ලසන්ත නිදගත්තට පස්සේ ඇලිස් සඟවලා තිබුණු බැලුම් බෝල එළියට ගත්තා පාට පාට කොළත් තියෙනවානේ ඇය ගෙය සරසන්න සූදනම් වෙනවා. හැකි තරමින් පුංචි පුතාගේ සිත සනසන්න.

එක පාරටම තද සුළඟක් හැමුවා. යමක් පොල් අතු වහලට වැටෙන ශබ්දයක් ඇලිස් තිගැස්සුනා. ලසන්ත තද නින්දේ කුප්පි ලාම්පුව අරන් ඇලිස් පිලිකන්නට ගියා හරිම පුදුමයක් නත්තල් ගසේ අත්තක්. ලස්සන නත්තල් ගස් අත්තක් සුළඟට වැටිලා දෙවියෝ අපි දිහා බැලුවා. ඇයට කියවුනා. හිල්වු පරණ බාල්දියක් සොයා වැලි දැම්මා. නත්තල් ගස සිටෙව්වා බැලුම් බෝල , පාට කොළ වලින් නත්තල් ගස සැරසුවා පුතාගේ අලුත් ඇඳුම් කට්ටලය නත්තල් ගසේ එල්ලුවා ඇලිස් මේ සියල්ල කළේ හරිම පරිස්සමෙන් පුතා ඇහැරේවි කියලා.

නත්තල් දවස උදා වුනා. උදේ අවදි වු ලසන්තට ඇස් අදහා ගන්න බැරි උනා. ගෙයි මැද ලස්සන නත්තල් ගස තෑග්ගකුත් නත්තල් ගසේ එල්ලලා ලසන්තට හරිම සතුටුයි. පුතා අම්මට කීකරුව සිටි නිසා නත්තල් සීයා ගෙනාපු තෑගි. අම්මා හදලා තිබු කිරිබත් ලසන්ත කෑවේ හරිම සතුටෙන් අලුත් ඇඳුම් ඇඳලා ලසන්තයි අම්මයි පල්ලි යනවා පොල් අතු වහල උඩින් නත්තල් ගස බලා සිටියේ හරිම සොම්නසින්.

හැබැයි අද වන තුරුත් ලසන්තවත් එයාගේ අම්මවත් දන්නේ නැහැ. නත්තල් ගහ ලැබුනේ කොහොමද කියලා.

# ජේසු කුමරුව හඳුනා ගනිමු

'අයියෙ ජේසු ඉපදුන දවසෙ ඇයි වල්ගා තරුවක් පෑයුවේ?' ලොකු අයියාට තුරුළු වී සිටි මම අහස දෙස බලමින් ඇසුවෙමි. "නංගියො, අහසෙ ගොඩාක් තරු පායලා තියනවා අපිට පේනවා. සමහර තරු ගොඩාක් ලොකුයි, සමහර තරු ගොඩාක් පුංචියි. නමුත් මේ හැම තරුවක්ම රාත්‍රී අඳුරු අහස ලස්සන කරන්න උදවු වෙනවා. ඒ හැම තරුවකටම වඩා නත්තල් දින පායපු වල්ගාතරුව බොහොම විශේෂ එකක්. මන්ද ඒ තරුව තමයි ලෝකෙට හඬගාල කීවේ සාමයේ කුමරාණන් මෙලොව ඉපදිලා කියලා. පාපයේ අඳුර දුරලන්නට නව ආලෝකයක් ඇවිල්ලා කියලා."

"ඉතිං ඉතිං ඒ කොහොමද අයියෙ?" මේ ගැන දැනගන්නට තිබූ ආසාව නිසාම මම තවදුරටත් ප්‍රශ්න අසන්නට වීමි. "නංගි, මේ ලස්සන තරුව තමයි ජේසු බබාව බලන්න එන්නට පාර කියා දුන්නෙ. බොහෝ දුර කතර ගෙවාගෙන ආපු රජතුන් කට්ටුවට ඒ වගේම එදා ඒ සීතල රෑ නිදාගෙන හිටපු එඬේරු පිරිස අවදිවුනෙත් මේ තරුවේ දීප්තිය දැකලා."

"හොඳයි.... එදා ඒ පායපු වල්ගා තරුව ඇයි අද නත්තල් දා රෑට පායන්නෙ නැත්තේ?" "ඔව් නංගි, ඒ තරුව දෙසැම්බර් 25 වනදාට විතරක් නෙවෙයි, ඒක හැමදාම පායලයි තියෙන්නෙ. නමුත් ඒක අපිට තේරෙන්නෙ නැහැ. තරුව නොපෙනුනත් තරුවත් එක්ක ලොවට පැමිණි ජේසු බබා හැමදාමත් අපි ළඟ ඉන්නවා. ඒත් අපි එයාව හඳුන ගන්නේ නැහැ."

"අපි කොහොමද ජේසු බබා හඳුනාගන්නේ?"

"ජේසු බබාව හඳුනාගන්නට අපිට තරු අවශ්‍ය නැහැ. අපේ දෙමාපියන්, සොයුරු සොයුරියන්, අපේ ගුරුවරුන්, යහළුවන්, අසල්වැසියන් යන මේ හැමදෙනා තුළම ජේසුව දකින්නට ඕනා. ඒ නිසා අද අපි ජේසුව බලන්නට තරුව පායනකම් බලන් ඉන්නට අවශ්‍ය නැහැ. මන්ද ජේසු බබා මා තුළ එකිනෙකා තුළ හැමදාමත් ඉන්නවා."

**එල් වාසනා ඩිලුක්ෂි ප්‍රනාන්දු**
6 ශ්‍රේණිය
සා. සේවියර් දහම් පාසල - හල්පෙ



# නත්තල් සීයාට ලියුමක්

**සුබ නත්තලක් !**



ඉස්කෝලෙ නිවාඩු දුන්න දවසෙ ගෙදර ආව පුංචි පුතා කෑම කන්නෙත් නැතිව ඉඳගෙන මොනවදෝ ලිව්වා. පුතා ඇඳුම් මාරු කරලා මූණ සෝදන් එන්න බත් කන්න. ''අම්මේ මම ජේසු බබාටයි නත්තල් සීයටයි ලියුම් ලියනවා. ටීචර් අපි හැමෝටම කිව්වා ගෙදර ගිය ගමන් ලියුම් ලියන්න කියලා. හා.... හා...... ටීචර් කිව්ව නම් ලියලා එන්නකෝ.

ලියුම් ලියපු පුංචිපුතා දුවලා ගිහින් ඒවා සුරුවම ළඟ තියන්න හදනවා. ඒත් එයාට උස මදි. 'අම්මේ ටිකක් එන්නකෝ ටීචර් කිව්වා පස්සේ නියම තැන තියන තුරු ජේසු ළඟ පරිස්සමට තියන්න කියලා. මට උස මදිනේ'. 'ආ එන්න මම පුතාව උඩට උස්සන්නම් ඔයාම තියන්නකෝ ඉතිං මොනවද ඔය ලියුම් වල ලිව්වේ ''බෑ බෑ අම්මට දැන් කියන්න බෑ ඒක රහසක්''

'හා... හා... දැන් හොඳ පුතා වගේ ඇඳුම් මාරු කරන්නකෝ මූණකට හෝදලා අපි බත් කමු. 'අම්මේ ගවලෙන හැදුවාම ජේසු බබාගෙ ලියුම ගවලෙනෙයි නත්තල් සීයාගෙ ලියුම නත්තල් ගහෙයි එල්ලන්න කිව්වා. අපි තාත්තට කියමු ඉක්මනට නත්තල් ගහක් ගෙනැත් දෙන්න කියලා' බත් කන ගමන් පුතා කිව්වා.

''ගවලෙන හදන්න ඔයාට පුලුවන් නේද?'' ඔව් නලිනුයි මායි එකතු වෙලා අපි දෙන්නම ගවලෙන හදන්නයි ඉන්නේ'' කෑම කාපු ගමන් පුතා දිව්වේ එයාගේ යාලුව නලින්ගේ ගෙදර. නලින්ගෙ ගේ තියෙන්නේ අපේ ගෙට අල්ලපු වත්තේ. දෙන්න එක්කලා තමයි සෙල්ලම් කරන්නේ පුතා හිනා වෙවී ආපහු දුවගෙන එනවා. අද එයාට සෙල්ලමත් අමතකයි වගේ. 'අම්මේ නලිනුත් ලියුම් ලියලා ජේසු ළඟ තිබ්බලු. කෝ තාත්තා තවම ගෙදර ආවේ නැද්ද? 'ඇයි පුතේ තාත්තා ගෙදර එන්න තව වෙලා යනවනේ' තාත්තා ගෙදර ආවම නත්තල් ගහක් ගෙනැත් දෙන්න කියන තුරු පුතාට ඉවසිල්ලක් තිබුනේ නෑ.

පහුවදා ඉඳන්ම යාලුවෝ දෙන්නා එකතුවෙලා බටකෝටු කපාගෙන ගවලෙන හැදුවා. කොහොම හරි දවස් දෙක තුනක් යනකොට දෙන්නගෙම ගවලෙන හදලා ජේසු බබාට ලියපු ලියුම් ගවලෙන තුළ තියලා තිබුනා. ඊට පස්සේ පුතා හැමදම තාත්ත ළඟට වෙලා නත්තල් ගහක් ගෙනැත් දෙන්න කිව්වා. පුතාගෙ ඇවිටිල්ල නිසාම තාත්තා නත්තල් ගහකුයි සැරසිළියි ගෙනත් දුන්න. පුතාට හරි සතුටුයි. 'තාත්තා අපි නත්තල් ගහ හදමු නේද? '' 'අනේ පුතේ වැඩ කරලා තාත්තට මහන්සියි. හොඳ පුතා වගේ හෙට අම්මව අඬගහගෙන පුතාම හදන්නකෝ ' තාත්තා කිව්වා.

පහුවදා උදේ ඉඳලාම පුතාට ඕන උනේ නත්තල් ගහ හදලා නත්තල් සීයගේ ලියුම ඒකේ එල්ලන්න. ඒ නිසා මම පුතාට නත්තල් ගහ හදලා සැරසිළි එල්ලන්න උදව් කළා. 'අම්මේ මගෙ නත්තල් ගහ පෙන්නන්න නලින්ව එක්ක එන්නම් කියූ පුතා දිව ගොස් නලින්වත් එක්කරගෙන එක පිම්මට දුවගෙන ආවා.

**ආදරණීය නත්තල් සීයේ,**

**ඔයා අද රෑට මට තෑගි ගේනවා නේද? තාත්තා මට අලුත් ඇඳුම් ගෙනත් දුන්නා. ජේසුබබා බලන්න යද්දි මම ඒක ඇන්ද. නලින් ඉස්කෝලෙට අඳින ඇඳුම ඇඳලයි ජේසු බබා බලන්න ආවේ. අලුත් සූට් ගේන්න නලින්ගේ තාත්තාට බැරි වෙන්න ඇති. එයාට සෙල්ලම් බඩුවක් නැතිව ඇති. ඒ හින්ද මගෙ තෑගිත් නලින්ට ගිහින් දෙනවාද? එතකොට එයාට ආසා හිතෙයි.**

මීට ආදරණීය
නිසල් පුතා

'අනේ හරි ෂෝක් නිසල්ගෙ නත්තල් ගහ හරි ලස්සනයි'' කොහොමද නලින් පුතා ගවලෙනයි නත්තල් ගහයි හැදුවද? ආ ඔව් නැන්දේ ගවලෙන නම් හැදුවා. තාත්තට කියන්න ඕනෙ මටත් නත්තල් ගහක් ගෙනත් දෙන්න කියලා. හවස ඇඳිරි වැටුනට පස්සේ නලින් අඬන සද්දයක් ඇසුණා. පුතා මා ළඟට දුවගෙන ආවා ''අම්මේ නලින් අඬනවා මං ගිහින් බලන්නද? එපා පුතා දැන් රෑ වෙලානේ නලින්ගෙ අම්මා එයාව බලාගනියි'' මූණ නරක් කරගෙන එතනින් අහකට ගිය පුතා පහුවදා උදෙන්ම ගිහින් නලින්ව බලලා ආවා.

'අම්ම දන්නවද ඊයෙ රෑ නලින් අඬලා තියෙන්නේ ඇයි කියලා' මම දන්නේ නෑනෙ ඉතින් පුතා ඇහැව්වද? 'ඔව් නත්තල් ගහක් අරන් දෙන්න එයාලගෙ තාත්තට සල්ලි නෑ කිව්වම දුක හිතිලා ඇඬුවලු ඒක නිසා නලින්ගෙ අක්ක අද උදේම කඩේට ගිහින් බැලුම් ගෙනත් මිදුලේ තියෙන පේර පැළේ එල්ලලා නලින්ට නත්තල් ගහක් හදලා දීලා.

ඉතිං නත්තල් සීයට ලියපු ලියුමත් නලින් ඒකේ එල්ලලා. පාට පාට බැළුම් නිසා නලින්ගෙ නත්තල් ගහත් ලස්සනයි. දවසක් දෙකක් යනකොට නලින්ගේ නත්තල් ගහේ තිබුන සමහර බැළුම් පුපුරලා තව සමහරක් හුලං බැහැලා. යාළුවා ආයෙමත් අඬනවා කියලා පුංචි පුතත් හරි දුකෙන් හිටියා. ''පුතේ ඔයා කැමති නම් ඔයාගේ නත්තල් සැරසිලි ටිකක් යාලුවට දෙන්න. අනේ ...හරි ෂෝක් නේ මම එහෙනම් ගිහින් දෙන්නද?

පුතා ගිහින් තාත්තගෙ නුත් අහලා දෙන්න තාත්තේ අපේ නත්තල් ගහේ තියෙන සැරසිලි වලින් ටිකක් නලින්ට දෙන්නද? එයාගේ නත්තල් ගහේ එල්ලන්න සැරසිලි මොනවත් නෑ'' ආ ඒක කොච්චර හොඳද? තමන්ට තියෙන දෙයින් කොටසක් නැති අයට දෙන එක හොඳ වැඩක්, ඒ අයට ජේසු බබා හුඟක් ආදරෙයි එහෙම කියලා තාත්තා නත්තල් ගහේ තිබුනු සැරසිලි වලින් කොටසක් ගලවලා පුතාට දුන්නා. මගෙ හොඳ තාත්තා' කියූ පුතා ඒවත් අරගෙන දිව්වේ යාලුවට දෙන්න. ටික වෙලාවක් යනකොට යාලුවෝ දෙන්නා බොහොම සන්තෝසෙන් සිනාසෙන හඬ අපට ඇසුනා.

**ඉතිරිය VII පිටුවේ .**

**පද්මා ප්‍රනාන්දු**
දුම්මලදෙනිය

VI පිටුවේ ඉතිරිය.

# ජාත්‍යන්තර පාසලේ නත්තල් කැරොල් ගායනා

## සුබ නත්තලක් !



වත්තල හැඳල 'යෝර්ක්' ජාත්‍යන්තර පාසලේ නත්තලට සමගාමීව පවත්වනු ලබන උත්සව මාලාවේ කැරොල් ගායනා වැඩසටහන පසුගියදා නායකකන්ද ශා. මරියා දේවස්ථානයේදී පැවැත්වූ අතර 'යෝර්ක්' ජාත්‍යන්තර පාසලේ සිසු දරු දැරියන්, ගුරු මණ්ඩලය, දෙමව්පියන් හා සමඟ, නායකකන්ද මීසම් සේවක ගරු මහෙන්ද්‍ර ගුණතිලක පියතුමා මෙයට සම්බන්ධ විය ඡායාරූපයෙන් දැක්වෙන්නේ 'යෝර්ක්' ජාත්‍යන්තර පාසලේ කුඩා දරු දැරියන් කිහිප දෙනෙකු කැරොල් ගායනයට එක් වූ අවස්ථාවයි.

සටහන හා සේයා: තිළිණ අලහකෝන්

**ලබන සතියේ ළමා ප්‍රදීපය පළ නොවේ..**

**නත්තල් නිවාඩුවට කොළඹ කතෝලික මුද්‍රණාලය වසා තැබෙන බැවින් ආදර දුවේ , පුතේ ළමා ප්‍රදීපය ලබන සතියේ (දෙසැම්බර් 31) දින පළ නොවේ. නැවතත් සුපුරුදු පරිදි 2013 ජනවාරි 07 වන දින සිට පළ කෙරේ .**

**(සංස්කාරක පියතුමා )**

# නත්තල් සීයාට ලියුමක්...

මෙහෙම දවස් ගෙවන කොට නත්තල් දවසත් උදා උනා. අපි හැමෝම නත්තල් ද රෑ පූජාවට ගිහින් ආව ගමන් තාත්තා ජේසු බබාව බොහොම ගෞරවයෙන් ගවලෙනේ තැන්පත් කළාම අපි හැමෝම දණගසා ජේසු බබාට නමස්කාර කළා.

ඊට පස්සේ පුතා ගේ ඇතුලට දුවලා ගිහින් කොලේක ආයෙත් මොනවාද ලියලා ගෙනත් නත්තල් ගහේ එල්ලුවා. පුතා එන්න නිලා පත්තු කරමු. අද බෑ තාත්තේ අපි හෙට නලින්වත් අඬගහන් පත්තු කරමු.මොකද මේ පුතා දුකින් වගේ ඉන්නේ තාත්තා හෙමින් මගෙන් ඇසුවා. මටත් ඒ බව හොඳින් දැනුනත් හේතුවක් දැනගෙන සිටියේ නැහැ. සමහර විට නිදිමත ඇති මම කීවා

''අම්මේ අද රෑට නත්තල් සීයා අපේ ගෙදර එයි නේද? ආ ඔව් පුතා නත්තල් සීයා අද රෑට තමා එන්නේ. මම නත්තල් ගහේ එල්ලපු ලියුම් බලයි නේද, ඔව් නත්තල් ගහේ ලියුම් එල්ලන්නෙ නත්තල් සීයට නේ. සීයා ඒවා බලයි. හැබැයි අපි නිදා ගත්තම තමයි නත්තල් සීයා එන්නේ. හොඳයි එහෙනම් අපි ඉක්මනටම නිදා ගමු. කියු පුතා ඇඳට නැගලා ඇස් වසාගත්තා. ටිකක් වෙලා යනකොට පුතාට නින්ද ගියා.

ඔය අතරෙ මට හිතුනා පුතා ආපහු නත්තල් ගහේ එල්ලපු කොලේ මොනවද ලියලා තියෙන්නේ කියලා බලන්න. මම ඒ කොලේ අතට අරගෙන කියෙව්වා පුතා ආයෙත් ලියුමක් ලියලා තිබුනා නත්තල් සීයාට. පුතා ඒ ලියුමේ ලියලා තිබුනදේ කියෙව්වාම මට දුකක් වගෙම සතුටක් දැනුනා.



**සවින්දි ගයාරා**
4 ශ්‍රේණිය
ශු. මිකායෙල් අග්‍රදූත දහම් පාසල
නාගොඩ - කළුතර



**හිමංසලා මල්ෂානි**
2 ශ්‍රේණිය
සිරිහඳ දහම් පාසල
බොල්ලත



**නිපුනි නවෝදා පෙරේරා**
7 ශ්‍රේණිය
ශාන්ත ජෝශප් බාලිකා මහා විදුහල
ග්‍රෑන්ඩ්පාස් - කොළඹ 14

**ශෙනායා ප්‍රනාන්දු**
3 ශ්‍රේණිය
ශුද්ධවූ පවුලේ කන්‍යාරාමය
බම්බලපිටිය



# පෙර පාසල් විවිධ ප්‍රසංග



කලමුල්ල මීසමේ කුඩාමල කන්‍යාරාමයේ ළදරු පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය ළදරු පාසලේ පාලිකා ගරු පැවිදි සොහොයුරියන් හා ආචාර්ය මණ්ඩලයේ මෙහෙයවීමෙන් පසුගියද කලමුල්ල මීසම් සහයක ගරු දුලිප් කමල් කළුතර දහම් සෙවන දෙව්සත්හලේ ගරු ප්‍රගීත් චාමර යන පියතුමන්ලාගේ හා කටුකුරුන්ද කන්‍යාරාමයේ ගරු ප්‍රධාන මව්තුමියගේ ප්‍රධානත්වයෙන් ළදරු පාසල් ශාලාවේදී පැවැත්විණ. එහිදි දරු දැරියන් සමූහ ගායනයකට එක් වූ අයුරු.

**සටහන -: ඇන්ටනි ප්‍රනාන්දු / සේයා -: ස්ටුඩියෝ රනිල් බේරුවල**



## සුබ නත්තලක් !

බේරුවල, සාන්ත ජෝශප් පෙර පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගය හා ත්‍යාග ප්‍රදානෝත්සවය බේරුවල මීසම් සේවක ගරු චමින්ද රෝෂාන් පියතුමාගේ ප්‍රධානත්වයෙන් පසුගියද පැවැත්වුනි. ප්‍රධාන පාලිකා ඇනස්ටා ප්‍රනාන්දු මහත්මිය මෙහි කටයුතු සංවිධානය කළාය.

නිරෝෂන් ප්‍රනාන්දු - බේරුවල

## උපතක අසිරිය

සුර ගී මනහර රැව් දෙන්නේ
සාමයෙ රැස් නිති දිදුලන්නේ
උපතක සිරියයි ලොවට වඩින්නේ
සාමයෙ කුමරෙකි හිනැහි ඉන්නේ
බෙත්ලෙහෙමේ පුංචි ගවහලේ
ලොව නිදියන අඳුරු රැයේ
සීතලේ මව් උණුසුමේ
නැළවෙන්නේ ජේසු පුතා.....
ඇතින් දිදුලන තරුව සොයා
රජවරු පැමිණා පඬුරු පුදා
දෙව් බිලිඳා දැක තුටිනා
පුද දෙන්නා සිරස නමා

**ලලිතා පීරිස් (ආචාර්ය මඩුල්ල)**
**මො/ මහා මාත්‍ය විද්‍යා විද්‍යාලය - බිබිල**

## අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජ කැරොල් ගායනා තරග ප්‍රතිඵල

කොළඹ අගරදගුරු පදවි ධර්මදූත ළමා සමාජය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන කැරොල් ගායනා තරග පසුගියදා වත්තල සා. ආනා දේවස්ථාන ශාලාවේදී පැවැත්වුනි. මේ සඳහා දිසා 11 ක් නියෝජනය කරමින් කණ්ඩායම් 13 ක් සහභාගි විය. මෙම තරගයේ ජයග්‍රහකයෝ මෙසේය.

**සිංහල අංශය**

පළමු ස්ථානය - කටාන දිසාව - බඩල්ගම මීසම
දෙවන ස්ථානය - ගුරුබැවිල දිසාව - වග මීසම
තෙවන ස්ථානය - මැද කොළඹ දිසාව - කොලොන්නාව මීසම

**දමිළ අංශය**

පළමු ස්ථානය - මැද කොළඹ - බොරැල්ල මීසම
දෙවන ස්ථානය - දකුණු කොළඹ - තිඹිරිගස්යාය මීසම

(කොළඹ අගරදගුරු පදවි ධර්මදූත කාර්යාලය)



සිතුවම :- ජුඩ්.ජේ. ප්‍රනාන්දු - ගෙලිඔය

**"ළමා ප්‍රදීපය" පාඨක , ලේඛක, සිත්තරුන් වන පුංචි ඔබ සැමට ලබන්නාවූ නත්තල සුභ නත්තලක්ම වේවායි පතන්නේ සංස්කාරක ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා ඇතුළු ළමා ප්‍රදීපය කාර්යාලයේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් සහකාර සංස්කාරක ශිරාන් මෛත්‍රි , පරිගණක ශිල්පිණි තරුෂිකා ප්‍රනාන්දු, පිටු සැකසුම ක්‍රිෂාන්ති පෙරේරා හා මුල් පිටුව සරසන තිළිණ අලහකෝන් යන නැන්දලා, මාමලායි.**